තේමා ලිපි

# "වැව් මාළු හා වෙල් මාළු" "නව කෘෂිකර්මය" අර්ථවත් කරන උපාය මාර්ගයක්

මෙරට ජනතාවගේ ජීවන ක්‍රමය හා සර්වප්‍රකාරයෙන්ම බැඳුන අපගේ සම්ප්‍රදායික ගොවිතැන විදේශ අධිරාජ්‍යවාදීන්ගේ ආර්ථික හා දේශපාලන රටාවට අනුගත කරනු පිණිස සම්පූර්ණයෙන්ම වෙනස් කරන ලද්දේය. පෙර රජ දවසේ සිට පැවති ස්වභාව ධර්මය සමග සහජීවනයෙන් ජීවත් වන බහුබෝග වගා කෙරෙන ස්වයං පෝෂිත ගොවිතැන වෙනුවට වෙළඳ පොළ මූල්කරගත් ඒක බෝග වගා ක්‍රමය මෙරට ගොවිජනතාව වෙත බලයෙන් පටවන ලදී. හරිත විප්ලවය වශයෙන් පසු කලකදී හඳුන්වාදෙන මෙම ක්‍රමය මගින් සැලකිය යුතු ප්‍රමාණයකට ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය වූවද, එමගින් මෙරට සමාජ ආර්ථික හා දේශපාලනික දේහයට කරන ලද හානිය සුළුපටු නොවේ. එසේනම් අප විසින් අනුගමනය කළයුතු මාර්ගය කවරේද? මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයන්නේ මෙරටේ සුප්‍රකට රාජ්‍ය නිලධාරියෙකුවූ, කෘෂිකර්ම ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙකු වන ඩී.එම්. ආරියරත්න මහතාය.
මෙම ලිපියේ අදහස් පිළිබඳව අපගේ පාඨකයනට ප්‍රතිචාර දැක්වීමටද ඉඩ ප්‍රස්ථා සලසා ඇතිබව සංස්කාරක මණ්ඩලය නිවේදනය කරයි.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ
උපදේශක
ඩී.එම්. ආරියරත්න විසිනි.

කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය විසින් 1995 සිට දියත් කරන ලද නිර්මාණාත්මක කාර්ය පර්යේෂණ හා අධ්‍යයනයන් කිහිපයක් මගින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයෙහි ආයතනික විද්‍යාත්මක හා තාක්ෂණික යථාර්ථයන් රාශියක් අවබෝධ කර ගැනීමට හැකියාව ලැබිණ. ඒ අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයෙහි අභ්‍යන්තරික ව්‍යුහය ඉතාම දුර්වල තත්ත්වයක පවත්නා බවත්, එය විවෘත ආර්ථිකයක් විසින් උද්දීපනය කර ඇති දුෂ්කරතාවයන්වලට හා අභියෝගයන්වලට මුහුණදීමට කිසිසේත් නුසුදුසු තත්ත්වයක පවත්නා බවත් වැඩිදුරටත් හෙළිවිය. දකුණු ආසියාතික කලාපයේ වුවද ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය නිපවුම හා නිෂ්පාදන ඵලදායිතා මට්ටම් වශයෙන් ස්ථිතික හෝ අඩුවෙමින් පවත්නා තත්ත්වයක තිබීමෙන් ආර්ථික වශයෙන් ලාභදායක නොවන කාර්යයක් බව හෙළි වී ඇත. ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව ප්‍රජාවක් වශයෙන් සමාජ-ආර්ථික රාමුවෙහි පහළම ස්ථරයේ සිටින බව පැහැදිලි විය. එම ජනතාවෙන් බහුතරයක්ම දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන්වල ප්‍රතිලාභීහු වෙති. ආදායම් ඉපැයීම් සම්බන්ධයෙන් විශේෂයෙන් වී සහ අතිකුත් අතිරේක භෝග වගාව පාඩු සහිත කාර්යයක් බවද රහසක් නොවේ. ක්‍රම-ක්‍රමයෙන් නිෂ්පාදන වියදම් ඉහළයමින් පවතින අතර, ලැබෙන අස්වැන්න ස්ථිතික තත්ත්වයක හෝ අඩුවෙමින් හෝ පවතී. ගොවි ජනතාවගෙන් බහුතරයක් "දිළිඳු ඉර" මත්තෙහි හෝ ඉන් පහළ මට්ටමකට වැටෙන තත්ත්වයක ජීවත් වෙති. මේ අනුව "ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය දිළිඳුභාවය වර්ධනය කරන්නාක් මෙන්ම එයින් බිහිවන්නේ දිළින්දන්" යයි කිසිවෙකුට උප කල්පනය කළහැකිය. සමස්ථයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයෙහි නියැලී සිටින බහුතර ගොවි ජනතාව දාරිද්‍රතා මට්ටමේ ජීවත්වන

අතර සමාජ-ආර්ථික පද්ධතියේ ඉමෙහි රැඳී සිටිමින් විවෘත ආර්ථික ඒකාධිකාරී ප්‍රවණතාවයන්වලට හා ආභාශයන්වලට මුහුණදීමට තරම් කේවල් ශක්තියක් නොමැති පිරිසක් බවට පත්වී සිටිති.

ශ්‍රී ලංකාවේ වතු වැවිලි අංශයෙන් බාහිර කෘෂිකර්මය බොහෝ සෙයින් තවමත් කෙරෙන්නේ ලාභ-අලාභ මත පදනම් වූ ආර්ථික කාර්යයක් වශයෙන් නොව, හුදු සාම්ප්‍රදායික සමාජ පැවැත්මක ආකාරයට වන හෙයින්, උගත් තරුණ පරම්පරාව ඒ හා සම්බන්ධවීමට කිසිසේත් කැමැත්තක් නොදක්වන බවද හෙළි වී තිබේ. මෙය අමතරව විශේෂයෙන් වතු වැවිලි අංශයෙන් බැහැර කෘෂිකර්මය සඳහා වෙන්වී ඇති භෞතික සම්පත් පදනම විවිධ හේතූන් නිසා ක්‍රම-ක්‍රමයෙන් පටුවෙමින් පවතී. මීළඟ වර්ෂ දෙක-තුන තුළදී මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ඉතාමත් ප්‍රබල දුෂ්කරතාවයන් රාශියකට මුහුණදීමට සිදුවනු ඇත. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වන ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය පරිභෝජන අවශ්‍යතාවයන්ට ප්‍රමාණවත් නොවීමෙන්, වර්ෂයක් පාසා ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම පිණිස විශාල ධනයක් වැය කිරීමට සිදුවේ. මෙසේ ආනයනය කිරීමට සිදුවන ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය ස්වභාවික හා අනපේක්ෂිත ආපදාවන් හා දේශගුණික හා කාලගුණික විපර්යාසයන් නිසා අඩුවැඩි වේ. මෑතක ලත් අත්දැකීම් අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය, විශේෂයෙන් වී හා අතිරේක ආහාර භෝග නිෂ්පාදනය මෙවැනි අවිනිශ්චිත කාලගුණික හා දේශගුණික විචල්‍යතාවයන්ට නිරන්තරයෙන් ගොදුරුවන තත්ත්වයක පවතී. ආහාර අතින් ස්වයංපෝෂණය හා සුරක්ෂිතතාවය ගැන කල්පනා කිරීමේදී ශ්‍රී ලංකාවේ තත්ත්වය සතුටුදායක යැයි කිය නොහැක. වර්ෂය පුරාම ජනතාවට ප්‍රමාණවත් හා පෝෂ්‍යදායක ආහාර වේලක් සැපයෙන ලෙසටම ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව වැඩි අවධානයක් යොමුකළ යුතුව ඇත.

වර්ෂයක් පාසා අධ්‍යාපනික ආයතනවලින් පිටවන හා උසස් අධ්‍යාපනය නොලබා අතරමග නතරවන තරුණ පරම්පරාවට රැකියා අවස්ථාවන් සපයාදීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය ඉදිරියේ මහත් අභියෝගයක් ඇත. හුදු විදේශ ආධාර හා ණය මත පමණක් පදනම් වී ඇති කාර්මීකරණ ප්‍රතිපත්තියක් මගින් මේ සඳහා ප්‍රමාණවත් පිළියමක් සොයාගත හැකි නොවේ. කොටින්ම කියතොත් නිදහස ලබා අවුරුදු පනහක් තුළ දැරූ විවිධ ප්‍රයත්නයන් වලින් හා අයෝජනය කරන ලද සම්පත් සම්භාරයකින් පසුව වර්තමානයේ ද ශ්‍රී ලාංකික කෘෂිකර්මයේ තත්ත්වය එතරම් සතුටුදායක යැයි කිව නොහැක. පසුගිය දශකය පුරා වර්ෂයකට 2%ක් වශයෙන් හෝ සාමාන්‍ය ජාතික අනුපාතයෙන් අර්ධයක් වශයෙන් හෝ කෘෂිකාර්මික ක්ෂෙත්‍රයේ වර්ධනය ඉතා පහළ මට්ටමක පැවතිනි.

දේශීය ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය වශයෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකාවේ වතු වගාවට අයත් නොවන කෘෂිකර්මය දැනට සංවර්ධනයේ සේයාවක් නොමැති තරම් පසුබෑමට ලක්වී ඇත. පසුගිය වසර දහයේ සිට පහළොව දක්වා වූ කාලයතුළ එම ක්ෂේත්‍රයෙහි ගම්‍යතාවය ගිලිහී ගොස් ඇත. අක්කරයක භෝග වගාවෙන් ලැබෙන අස්වනු ප්‍රමාණය, මුළු වාර්ෂික නිපැයුම, වාරි ජලයෙන් පෝෂිත ඉඩම් භාවිතයේ තීව්‍රතාවය, ගොවි පවුල්වල ආදායම් මට්ටම සහ රැකියා නියුක්තිය වැනි මූලික දර්ශකවලින් එම තත්ත්වය මැනවින් පිළිඹිබු කෙරේ. මේ වකවානුව තුළ විශේෂයෙන්ම ශ්‍රමික මෙන්ම යන්ත්‍රෝපකරණ වැනි කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය මහා පරිමාණ යෙදවුම්වල මිළගණන් කිහිපගුණයකින් ඉහළගොස් ඇති අතර, එහි ප්‍රතිඵලය වශයෙන් ගොවියාගේ නිෂ්පාදන වියදම් නොසිතූ විරූ අන්දමින් කිහිපගුණයකින් වැඩි වී ඇත. ඒ කෙසේවුවද කෘෂිකාර්මික නිෂ්පාදනවල ගොවිපොල මිළගණන් ඉහළ යමින් පැවති නිෂ්පාදන පිරිවැය හා සමානව වැඩිවී නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදකයාට ලැබුණ ප්‍රතිලාභ ක්‍රම ක්‍රමයෙන් පහත වැටිණ.

තවද සාමාන්‍යයෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන කෘෂිකාර්මික ද්‍රව්‍යවල මිළ අනපේක්ෂිත අන්දමින් අඩු-වැඩිවීමෙන් නිෂ්පාදකයාට වාසිදායක නොවන පරිදි ලැබෙන ආදායමේ විචල්‍යතාවයන් හා අස්ථිරභාවයන් දක්නට ලැබිණ. දේශීය කෘෂි නිෂ්පාදන පහත වැටීමත් සමඟ ආනයනික ආහාර ද්‍රව්‍ය කෙරෙහි, විශේෂයෙන්ම තිරිඟු ආදී ද්‍රව්‍ය කෙරෙහි යැපීම කරා රට යොමුවිය. සාම්ප්‍රදායික නොවන කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන පිරිවැය ඉහළයාමද අපනයනය සඳහා ජාත්‍යන්තර වශයෙන් පවත්නා තරඟකාරිත්වයට හානිකර බලපෑමක් සිදුකරන ලදී.

## තේමා ලිපි

පහළොස්වැනි ශතවර්ෂය වනවිට කුළුබඩු භෝග හා ඖෂධ වර්ග වගාව බෙහෙවින් ව්‍යාප්ත වී තිබූ අතර, සරුසාර අස්වැන්නක් ලබාදෙන තත්ත්වයට පත්වී තිබිණ. පෘතුගීසීන් හා ලන්දේසීන් ද පසුව ඉංග්‍රීසීන් ද එක්නෙකා සමග යුද වැදී ඇණකොටා ගනිමින්ද ශ්‍රී ලාංකික පාලකයන් සමග යුදවැදීමෙන්ද උත්සාහ කලේ මෙම සරුසාර කුළුබඩු හා ඖෂධ වගාවන් එකල ලෝකයේ පැවති "රන් ආකර" වශයෙන් සැලකුණු බැවිනි. මෙම භෝග රටාවට අනුව ගමට අවශ්‍ය සෑම ආහාර ද්‍රව්‍යයක්ම පාහේ ගමේ ඉඩම්වලම වගා කෙරුණු බව පැහැදිලිය. ඒ ක්‍රමය යටතේ ගම ආහාරයෙන්, බත-බුලතින් මෙන්ම බෙහෙත් හේත් වලින් ස්වයංපෝෂිත ඒකකයක් වශයෙන් පැවතිණ. වර්තමානයේ වුවද වියළි කලාපයේ මෙන්ම තෙත් කලාපයේ පුරාණ සිංහල ගම්වල ප්‍රධාන ජීවකා වෘත්තිය වන වී ගොවිතැනට අමතරව ගෙවතුවල බුලත්,කොස්,දෙල්, පොල්, කිතුල්,බෙලි,දොඩම්,පුවක්, දෙහි,අඹ, සියඹලා ආදී ගස් වර්ගමිශ්‍ර ක්‍රමයකට වගාකර තිබෙනු දැකිය හැකිය. මීට අමතරව ගෙවත්තේ විශේෂයෙන් ළිඳ ආසන්නයේ,හාතාවාරිය, කෝමාරිකා ආදී ඖෂධ වර්ග වගාකර තිබුණි. මේ මිශ්‍ර වැවිලි ක්‍රමයට කිසියම් විද්‍යානුකූල පදනමක් තිබූ බව වර්ථමාන ඇතැම් කෘෂි විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. "උඩරට ගෙවතු වගාව" වශයෙන් හැඳින්වෙන මෙම ක්‍රමය ජාත්‍යන්තර කෘෂි විද්‍යාඥයින්ගේ විශේෂ අවධානයට යොමුවී තිබේ.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය සම්බන්ධයෙන් ඉහත දැක්වූ ආයතනික, විද්‍යාත්මක හා තාක්‍ෂණික යථාර්ථයන්වලට අනුව එය ඉතා වැදගත් මංසන්ධියකට එළඹ ඇති බැව් පෙනේ. ක්‍රමයෙන් හීනවන ඉඩම්, ජලය ආදී ස්වාභාවික සම්පත් පදනමකින් වැඩි නිෂ්පාදනයක් ලබාගත යුතු බවත්, ඒ සඳහා පාරිසරික වශයෙන් චිරස්ථායි තාක්‍ෂණ ක්‍රම අනුගමනය කළයුතු බවත් අවධාරණය කළයුතු වේ. සමාජ-ආර්ථික වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය විසින් වැඩි වැඩියෙන් ආහාර පමණක් නොව, අදායම් හා ජීවන මාර්ගයන් හා රැ කීරක්‍ෂා අවස්ථාවන් ජනිත කළයුතුය. ප්‍රාථමික අමුද්‍රව්‍යවල වටිනාකම වැඩිවන සේ සකස් කිරීමෙන් සහ වෙනත් ආර්ථික කාර්යයන් මඟින් ආදායම් උපදවීමට එය සමත් විය යුතුය. භෝග වගාව හා සත්ව පාලනය, භෝග වගාව හා මත්ස්‍ය වගාව, කෘෂි වන වගාව හා අනෙකුත් ඒකාබද්ධ වගා රටාවන් මඟින් ආදායම් උපදවා ගැනීමේ අතිරේක මාර්ගයන් සහ කෘෂිද්‍රව්‍ය සකස් කිරීමේ අවස්ථාවන් පාදාගත හැකිය. සූක්‍ෂම වගා රටා මඟින් පවත්නා ඉඩම්, ජලය, ශ්‍රමය හා ප්‍රාග්ධන සම්පත් යොදා ගනිමින් ඒවායේ නිෂ්පාදන ඵලදායිතාවය උපරිම කරගත හැකිය. සූක්‍ෂම වගා රටා මඟින් ඉතිරිව පවත්නා වනාන්තර ප්‍රදේශ ආහාර නිෂ්පාදනයට යොදාගැනීම වලක්වා ගත හැකිය. පාරිසරික, සමානාත්මතා හා ආර්ථික මූල ධර්මයන් මත පදනම් වූ ඒකාබද්ධ සූක්‍ෂම වගා හා ගොවිපොළ සැලසුම් ක්‍රමයක් අවශ්‍යවන්නේ මේ නිසාය. 1995 සිට කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය ජනාධිපති කාර්ය සාධන මණ්ඩලයත් සමඟ සැලසුම් කරන ලද "නව කෘෂිකර්මය" පිළිබඳ ක්‍රියාවලිය අර්ථවත් කිරීමේ ප්‍රධාන මාර්ගයක් වශයෙන් මෙවැනි ගොවිපොල සැලසුම් ක්‍රමයක් ප්‍රයෝජනවත් අයුරු භාවිතා කළහැක.

ශ්‍රී ලංකාවේ ගොවීන් අතර විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල එම ප්‍රජාවන් අතර ඒකාබද්ධ ගොවිපොල ක්‍රමයක් පිළිබඳ දීර්ඝ සම්ප්‍රදායන් හා ඇබ්බැහිකම් රාශියක් පැවතිණ. ගමක වාසය කරන ගොවි පවුලක් විසින් ස්වකීය "ගෙදර" වශයෙන් සළකනු ලැබුවේත්, දැනුදු සළකනු ලබන්නේත් නිවාසය, නිවාසය පිහිටි ඉඩමේ ගෙවත්ත, ගමට අයත් වෙල්යායේ පිහිටි කුඹුරු ඉඩම හා ගමට යාබදව පිහිටි කැළෑ ප්‍රදේශයේ හේන යනාදී මෙම ඒකාබද්ධ ගොවිපොල ක්‍රමයට අයත් වූ අංගෝපාංගවල සංකලනයකි. ගමක තිබුණු වැව්වලින් ජලය ලබාගෙන ගොවිතැන් කරන ප්‍රදේශය "ගාමබෙත්ත" හෙවත් "කුඹුරු-උබර-තෙ-විය" යනාදී වශයෙන් හඳුන්වනු ලැබීය. මේවායේ වගා කළයුතු වී වර්ග ද නියමකර තිබුණි. කුඹුරුවලට අමතරව පිහිටි ගොඩ ඉඩම්වල හා හේන්වල අමු, මෙනේරි, මුං, තල,මැ ආදී ධාන්‍ය වර්ග ද උක්ගස් ද වගා කෙරිණ. මිහිඳු රජුගේ අනුරපුර පුවරු ලිපියට අනුව ගම්වල තිබුණු ගෙවල්

සහ යාබද ගෙවතුවල බුලත්, දොඩම්, දෙල්, කොස් ආදිය වවා තිබිණ. මේවාට අමතරව අඹ, සියඹලා, කෙසෙල්, කහ/ගම්මිරිස්, ඉඟුරු සහ වෙනත් කුළුබඩු වර්ග ද කෑමට ගන්නා අල වර්ග ආදී වගාවන් පිළිබඳව ද සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන්වේ. දහතුන් (13) වැනි ශතවර්ෂයේ සිට, විශේෂයෙන් දෙවැනි පැරකුම්බා සමයේ සිට පොල් වගාවන් මෙන්ම කුරුඳු වගාවන්ද සීඝ්‍රයෙන් දියුණු වූ බව සඳහන්වේ. විශේෂයෙන් පහළොස්වැනි ශතවර්ෂය වනවිට කුළුබඩු භෝග හා ඖෂධ වර්ග වගාව බෙහෙවින් ව්‍යාප්ත වී තිබූ අතර, සරුසාර අස්වැන්නක් ලබාදෙන තත්ත්වයට පත්වී තිබිණ. පෘතුගීසීන් හා ලන්දේසීන් ද පසුව ඉංග්‍රීසීන් ද එකිනෙකා සමඟ යුද වැදී ඇණකොටා ගනිමින්ද ශ්‍රී ලාංකික පාලකයන් සමග යුදවැදීමෙන්ද උත්සාහ කලේ මෙම සරුසාර කුළුබඩු හා ඖෂධ වගාවන් එකල ලෝකයේ පැවති 'රන් ආකර' වශයෙන් සැළකුණු බැවිනි. මෙම භෝග රටාවට අනුව ගමට අවශ්‍ය සෑම ආහාර ද්‍රව්‍යයක්ම පාහේ ගමේ ඉඩම්වලම වගා කෙරුණු බව පැහැදිලිය. ඒ ක්‍රමය යටතේ ගම ආහාරයෙන්, බත-බුලතින් මෙන්ම බෙහෙත් හේත් වලින් ස්වයංපෝෂිත ඒකකයක් වශයෙන් පැවතිණ. වර්තමානයේ වුවද වියළි කලාපයේ මෙන්ම තෙත් කලාපයේ පුරාණ සිංහල ගම්වල ප්‍රධාන ජීවන වෘත්තිය වන වී ගොවිතැනට අමතරව ගෙවතුවල බුලත්/ කොස්/ දෙල්/ පොල්/ කිතුල්/ බෙලි/ දොඩම්/පුවක්/ දෙහි/අඹ/සියඹලා ආදී ගස් වර්ගමිශ්‍ර ක්‍රමයකට වගාකර තිබෙනු දැකිය හැකිය. මීට අමතරව ගෙවත්තේ විශේෂයෙන් ළිඳ ආසන්නයේ හාතාවාරිය, කෝමාරිකා ආදී ඖෂධ වර්ග වගාකර තිබුණි. මේ මිශ්‍ර වැවිලි ක්‍රමයට කිසියම් විද්‍යානුකූල පදනමක් තිබූ බව වර්තමාන ඇතැම් කෘෂි විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. 'උඩරට ගෙවතු වගාව' වශයෙන් හැඳින්වෙන මෙම ක්‍රමය ජාත්‍යන්තර කෘෂි විද්‍යාඥයින්ගේ විශේෂ අවධානයට යොමුවී තිබේ.

ඈත අතීතයේ පටන්ම ශ්‍රී ලංකා වාසීන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තය හෙවත් 'ගොවිතැන' බව අවිවාදයෙන් පිළිගතහැකි වුවත්, මෙම 'ගොවිතැන' වී හා අනිකුත් ආහාර භෝග වගාවට පමණක් සීමා වූ කාර්යයක් නොවීය. වර්තමානයේ 'ඒකාබද්ධ ගොවිපල සැලසුම් ක්‍රමය' වශයෙන් හෝ මිශ්‍ර වගාව වශයෙන් හෝ හඳුන්වනු ලබන ක්‍රියාදාමය එකල සමාජ-ආර්ථික අවශ්‍යතාවයන්ට සරිලන පරිදි පැරැන්නන් විසින් ද අනුගමනය කරන ලද බව දිවයිනේ ඇතැම් පළාත්වල සිටි විශාල ගව රංචු ගැන පුරාණ කාලය පිළිබඳ කතාන්තරවල සඳහන් වෙයි. විශේෂයෙන් එළහරකුන් සහ මී හරකුන් ඇතිකිරීම මෙම ඒකාබද්ධ ගොවිපල ක්‍රමයේ ප්‍රධාන අංගයක් විය. හරකුන් ඇතිකිරීමෙන් ආහාර සඳහා එළකිරි, මීකිරි සම්පාදනය කර ගැනීමට මෙන්ම ගොම පොහොර ලබාගැනීමටත්, සීසෑම, වැපිරීම, කොළ මැඩීම, වැනි ගොවිතැනට අවශ්‍ය කාර්යයන් ඉටුකිරීම සඳහාත්, ප්‍රවාහන කටයුතු සඳහාත් යොදාගනු ලැබීය. කිරිවලින් ගිතෙල් සාදාගන්නා ලදී. ගිතෙල් ලබා ගැනීමට බැරි දුප්පතුන් හැර, අනෙක් අය අතර ගිතෙල් නැතිව බත් කෑමේ සිරිතක් නොවීය. පැරණි ශ්‍රී ලාංකික ජනතාව ගිතෙල් ඇතුළු පස්ගෝරස නිතර අනුභව කරන ලද බව ඉතිහාසයේ සඳහන් වේ. අවුරුද්දට එක් වරක්වත් විශේෂයෙන් අළුත් අවුරුද්ද උදාවීමට ආසන්නව කටුමැටියෙන් සාදන ලද ගෙවල් ගොම මිශ්‍ර හුඹස් මැටි ගා පිරිසිදු කිරීම වැදගත් අවශ්‍යතාවයක් ලෙස සලකනු ලැබීය.

ගව පාලනය සමඟ මත්ස්‍ය කර්මාන්තය ද රැකියාවක් වශයෙන් නොවුනත් ආහාර වේලට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ ලබාගැනීමේ අංගයක් ලෙස ගොවිතැන සමඟ සම්බන්ධ වී තිබූ බව පෙනේ. මුහුදෙන් මෙන්ම වැව්-අමුණු ඇල-දොළ, ගංගාවලින් හා කුඹුරු සහ ඒ ආශ්‍රිත පොකුණු ආදී ජලාශවලින් අල්ලාගනු ලැබූ මාළු එකල මිනිසුන්ගේ ආහාරයේ වැදගත් අංගයක් විය. මුහුදුබඩ ප්‍රදේශයේ මසුන් මරන්නන්ගේ ගම් පිහිටා තිබුණේය. මිරිදිය ජලාශවල මාළු පිළිබඳ අයිතිය ගැන පනවන ලද සවිස්තර නීතිරීති ද එකල තිබුණේය. ඈත අතීතයේ සිට මෙසේ විකාශනය වී ආ මේ සිරිත්-විරිත්, නීති-රීති, හා කාර්යයන් රොබට් නොක්ස් පැමිණි යුගයේදී ද තිබුණු බව ඔහුගේ ඓතිහාසික කතන්දරයෙන් පැහැදිලි කරගත හැකිය. රොබට් නොක්ස් ලංකාවේ ජීවත් වූ කාලයේ මිනිසුන්ගේ ආහාරය සඳහා මාළු වලින් කිසි හිඟයක් නොතිබුණ බව ද, එසේම ඉතාමත් හොඳ තත්ත්වයේ මාළු ශ්‍රී ලංකාවාසී මිනිසුන් අනුභව කරන ලද බව ද ඔහු විසින් සඳහන් කර ඇත. මීටියාවත් හා නිම්නයන් ඔස්සේ ගලා බසින ගංගා හා ඇල-දොලවල ඉතා බහුල වශයෙන් මසුන් ජීවත් වූ බව ඔහු සඳහන් කරයි. කෙළිලොල් වයස්කාර ළමුන් ඒ මසුන් විධිමත්ව වැඩෙන්නට පෙර, කුඩා මසුන් ඇල්ලීම කෙරුණු බව ද සඳහන් වේ. මසුන් ඇල්ලීම සඳහා භාවිතා කරන ලද 'කරක' හා වෙනත් ආම්පන්න සම්බන්ධයෙන් ද ඔහු සඳහන් කර ඇත. 'කරක' මගින් මාළු ඇල්ලීම 'කරක්ගැසීම' වශයෙන් හැඳින්විය. කන්නක් පාසා සිදුකරනු ලබන

"කරක් ගැසීමේ" කාර්යය ගොවිතැන හා කෙළින්ම සම්බන්ධව කෙරුණු විධිමත් කාර්යයක් බව පැහැදිලි කරගත හැකිය. (පළමුවන රූප සටහන)

කිසියම් ගම් ප්‍රදේශයක පිහිටා ඇති වැවක, ඇලක, දොලක හෝ අමුණක මත්ස්‍ය සම්පත් පොදු සම්පතක් වශයෙන් සැලකුණු අතර, එකිනෙකාට කැමති පරිදි එය පරිහරණය කිරීමට අවසරයක් තිබුණේ නැත. මේ සම්බන්ධයෙන් ඇත අතීතයේ සිටම නීති-රීති තිබූ බව සඳහන් වෙයි. ඉංග්‍රීසි පාලන යුගයෙහි මේ සම්බන්ධයෙන් ඇත අතීතයේ සිටම නීති-රීති තිබූ බව සඳහන් වෙයි. ඉංග්‍රීසි පාලන යුගයෙහි මේ සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ක්‍රියා පිළිවෙත ඇත අතීතයේ සිට ඓතිහාසිකව වර්ධනය වී ආ පිළිවෙතම බව පෙනේ. ඉංග්‍රීසි පාලන සමයේ ගම් මූලාදෑතියෙකුගේ බල ප්‍රදේශය වූ "වසම" තුළ පිහිටි වැව්-අමුණු, ඇළවේලි පාලනය සඳහා වෙල් මුලාදෑතිවරු ද වූහ. කන්නක් අවසානයේ ජලාශවලින් ජලය ලැබ කරන ලද භෝග වගාවේ අස්වැන්න නෙලා ගැනීමෙන් පසු අදාළ ජලාශයේ ජල මට්ටම ද බොහෝ සෙයින් අඩුවී ගිය අවස්ථාවේ එම ජලාශයේ මාළු ඇල්ලීම සඳහා ගම් මුලාදෑතියාගේ උපදෙස් පිට වෙල් මුලාදෑතියා විසින් දින නියම කරගනු ලැබේ. අදාළ ජලාශය යටතේ ගොවිතැන් සඳහා ඉඩකඩම් හිමි "පංගුකරුවන්" සියලුදෙනාම මෙම කාර්යයට සහභාගී විය යුතුය. නියම කරගත් දිනයේ උදය වරුවේ ජලාශය වෙත පැමිණෙන "පංගුකරුවන්" විසින් එකට එක්ව මාළු ඇල්ලීම හෙවත් "කරක් ගැසීම" සිදුකරනු ලැබේ. පෙවරුවේ ආරම්භවන මෙම කාර්යය ඉරහැරී හෝරා කිපයක් ගතවූ විට නවත්වා, සියළු දෙනා විසින් අල්ලාගනු ලැබූ මාළු විවිධ වර්ගවලට අනුව ගොඩවල් වශයෙන් ඒකරාශී කරනු ලැබේ. සියල්ලෝම ඒ වටා එක් රොක් වී වෙල් මුලාදෑනි තැන විසින් පංගු ලැයිස්තුව කියවනු අසා සිටිති. ගමේ ගම්මුලාදෑනියාට, වෙදැදුරුට, පන්සලට හා රෙදි සෝදන පවුල්වලට ඒකරාශී කරන ලද මාළු ගොඩවල්වලින් කොටස් වෙන්කර දෙනු ලැබේ. අනතුරුව පංගු ලැයිස්තුවේ සඳහන් "පංගුකරුවන්ට" එක් එක් අයට අයිති "පංගුවට" සමානුපාතිකව සියලුම වර්ගවල ගොඩවල්වලින් මාළු කොටස් බෙදාදෙනු ලැබේ. මෙසේ විධිමත්ව කෙරුණු "කරක් ගැසීම" හෙවත් මාළු ඇල්ලීම කන්නක් පාසාම සිදුවූ කාර්යයකි. (උඩරට "කොහොඹා කංකාරිය" නමින් හැඳින්වෙන ශාන්ති කර්මයේදී යද්දෙස්සන් රඟ දක්වනු ලබන යක්කම් පහෙන් එකක් වන ඌරා යක්කමේදී ඌරා කොටස්කර විවිධ වෘත්තීන්හි නිරතව සිටින සියළුම ගැමියන්ට බෙදාදීමක් කෙරෙයි. ඉහත සඳහන් අන්දමට මාළු ඇල්ලීමේදී මෙන් මුළු ගමම එකතු වී සංවිධානාත්මකව වැඩ කටයුතු කරගත්තා ආකාරය මෙම ජවනිකාවේදී මනාව පිළිඹිබු වෙයි.)



රූප සටහන 01

මේ හැර පුද්ගලයන්ට අයිති වූ අමුණුවල, වෙල්වල, පොකුණු වල සහ වලවල්වල මාළු අල්ලාගැනීමේ අයිතිය එම පුද්ගලයින් සතුවිය. වර්ෂා කාලයේදී ප්‍රධාන ජලාශ උතුරායෑමේදී හෙවත් වාන්දැමීමේදී එම ජලාශවලින් පෝෂිත කුඹුරු යායවල්වලට ද මසුන් සංක්‍රමණයවීමෙන් හා උතුරායෑම (වාන්දැමීම) නවතිනවිට ඉතිරිවන දිය කඩිතිවල මෙම මාළු බෝවීමෙන් "වෙල්මාළු" වශයෙන් අල්ලාගනු ලැබේ. මෙම ක්‍රියාවලියට සමානව මුහුදු තීරයේ ඇති කලපුවල "කලපු මාළු" ඇල්ලීමද දැනුදු ඉතා ප්‍රචලිත කාර්යයකි. "වෙල්මාළු හා කලපු මාළු" වෙනත් මාළු වර්ගවලට වඩා රසවත් හා ගුණදායක බව බොහෝ දෙනෙකුගේ මතයයි.

කෙසේවුවද මෙහිදී සඳහන් කළයුතු විශේෂ කරුණක් ඇත. අතීත ශ්‍රී ලංකාවේ ස්වභාවයෙන්ම මසුන් බෝවීමට ඉඩහැරීමක් හැර සිතාමතාම කර්මාන්තයක් සඳහා ඇති කිරීමක් පිළිබඳව ඉතිහාසයේ සටහනක් නොමැත. එහෙත් කන්ද උඩරට පාලනය කළ රජුගේ විනෝදය සඳහා විසිතුරු මසුන් ඇතිකිරීමක් සිදුවූ බව රොබට් නොක්ස් සඳහන් කර ඇත. එම මසුන් මිනිසුන් නොයෙකුත් ද්‍රව්‍ය කවන-පොවන ආකාරය තමා දුටු බවත් ඔහු සඳහන් කරයි. එහෙත් මෙම මසුන් ඇල්ලීම සම්පූර්ණයෙන්ම තහනම් වූ බවද, කිසිසේත් පරිභෝජනය සඳහා භාවිතා නොකරන ලද බවද රොබට් නොක්ස් වැඩිදුරටත් සඳහන් කරයි. ගව පට්ටි පාලනයද ඇතුළත් මොනරුන් හා ගිරවුන් වැනි සුරතල් පක්ෂීන් ඇති කිරීම ද කරන ලද්දේ මාංශ වශයෙන් අනුභව කිරීමට නොව, හුදු විනෝදයක් හා ගෙහිමියන්ට ආශිර්වාදය ලබාගැනීම පිණිසය.

1960 ගණන් පමණ වනතෙක් ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී වශයෙන් ඉහත සඳහන් අන්දමේ "ඒකාබද්ධ ගොවිපොළ සැලසුම් ක්‍රමයක්" දක්නට ලැබුණි. පුරාණ සිංහල ගැමි ව්‍යවහාරයේ "ගේ-දොර,ඉඩ-කඩම්, වතු-පිටි,බවභෝග, හරකා-බාන" වශයෙන් හඳුන්වනු ලැබුයේ මෙම ඒකාබද්ධ ගොවිතැන් රටාවට ඇතුළත් වූ භෞතික සම්පත් පද්ධතියයි. භෞතික වශයෙන් වෙනත් ආසියාතික රටවල්වල මෙන් එකම ගොවිපොලේ නොවුවද වෙන්වූ කුඩා ඉඩම් කට්ටිවල ධාන්‍ය වර්ග, අතිරේක ආහාර භෝග වර්ග, බෙහෙත් පැළෑටි, පළතුරු හා බුලත් වගාව, එළ හරකුන් හා මී හරකුන් ඇති ආදී කාර්යයන් සුළු පරිමාණ ගොවීන් විසින් ඉටුකර ගන්නා ලදී. වී වගාකරන ලද කුඹුරු ඉඩම් හා අතිරේක ආහාර භෝග වගාකරන ලද හේන ඒවායේ අස්වැන්න නෙළාගැනීමෙන් පසු හා ගෙවත්ත මාරුවෙන් මාරුවට හරකුන්ගේ පෝෂණය සඳහා භාවිතා කරනු ලැබීය. සෑම ගොවි ගෙදරකම පාහේ ධාන්‍ය හා වෙනත් භෝග ගබඩා කිරීම සඳහා පහසුකම් තිබුණ අතර, කෘෂි කර්මාන්තයට අවශ්‍ය උපකරණ හා ආම්පන්න ද ගොවීන් සතුව තිබිණ. එමෙන්ම අතිරික්තයක් වශයෙන් නිෂ්පාදනය කෙරුණු ධාන්‍ය, එළවළු හා පළතුරු කුළුබඩු වර්ග වියළි කල්තබා ගැනීමේ ප්‍රායෝගික ක්‍රමද පුරාණ සිංහල ගම්වල පැවතිණ. මේ ක්‍රමය ආර්ථික වශයෙන් ලාභ අලාභ සලකා විද්‍යානුකූලව ක්‍රියාත්මක වූ ක්‍රමයක් නොවූ බව ඇතැමුන් ප්‍රකාශ කරන නමුත් ආහාර වශයෙන් ස්වයංපෝෂිත. හා සුරක්ෂිත පදනමක් මත පවුලේ සියලු දෙනාටම එකතුවී හොඳින් කා-බී, අසල්වාසීන් සමඟ ද බෙදා-හදා ගැනීමට තරම් ප්‍රමාණවත් නිෂ්පාදනයක් ඒ මගින් ලබාගත හැකි විය. මේ අනුව රටට, ජාතියට බරක් හෝ හිරිහැරයක් නොවී ජීවත්වීමට මේ ක්‍රමය ශ්‍රී ලාංකික ගොවි ජනතාවට අනුබලයක් විය.

විධිමත් කෘෂි ව්‍යාප්ති සේවාවක් මගින් මේ ගොවිතැන් රටාව ආර්ථික, විද්‍යාත්මක හා තාක්ෂණික වශයෙන් වැඩිදියුණු කොට ලාභදායී වෘත්තියක් බවට පත්කරවීමට බෙහෙවින් අවකාශ තිබුණ නමුත් එවැන්නක් අවාසනාවකට මෙන් සිදුවූයේ නැත. මේ නිසා 1960 ගණන්වල සිට "හරිත විප්ලවයේ" ප්‍රතිඵල වශයෙන් බිහි වූ බීජ - පොහොර තාක්ෂණය "කෝකටත් තෛලය" වශයෙන් සැළකීමට ව්‍යාප්ති අංශ මෙන්ම ගොවීහු ද පුරුදු වූහ. අධික රසායනික පොහොර හා කෘමිනාශක, වල්නාශක ද්‍රව්‍ය යොදා ගතයුතු බීජ ප්‍රචලිත කිරීමෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කොට ගත හැකි කාබනික හා කොල පොහොර හා ස්වාභාවික කෘමිනාශක, වල්නාශක සම්පූර්ණයෙන්ම නොසලකා හරිනු ලැබීය. මීට අමතරව සාම්ප්‍රදායික හා පාරම්පරික ඥාණය හා පරිචයන් මගින් ආරක්‍ෂාකොට නඩත්තු කරගෙන ආ විශේෂයෙන් වියලි කලාපයේ ජලාධාර ප්‍රදේශ හා ග්‍රාමීය වැව්-අමුණු පද්ධති නොබෝ කලකින් අකර්මන්‍ය හා අජීවී තත්ත්වයට පත්විය. කෘෂිකර්මයට අවශ්‍ය ස්වාභාවික සම්පත් පද්ධතිය ඉතා සීග්‍රයෙන් විකෘත වූවා පමණක් නොව, ඒවා වෙනත් කාර්යයන්වලට යොදා ගැනීමෙන් ක්‍රමයෙන් පටු වන්නට විය. ඊට අමතරව භෞතික පරිසරයේ සිදුවන අසමතුලිතතාවයන් හේතුවෙන් කාලගුණික හා දේශගුණික විපර්යාසයන් පහළවීමෙන් නුහුරු-නුපුරුදු අන්දමේ නියඟ හා ජලගැලීම් තත්ත්වයන් දිවයිනේ ප්‍රදේශ රාශියකම සිදුවෙමින් පවතී.

## තේමා ලිපි

මෙම ක්‍රමයේදී පළමුවෙන්ම වගා ඉඩමේ විශාල වළක් ඇතිවන පරිදි පොළොව හරනු ලබයි. මෙසේ පොළොව කැනීමෙන්ලබාගන්නා පස් නිවාසවල අත්තිවාරම් දැමීම සඳහාත්, සතුන්ගේ ගාල් ඉදිකිරීම සඳහාත්, මෙම ඉඩමේ භෝග වගාවට සුදුසු උස් වැටි සහිත පාත්ති සකස් කර ගැනීම සඳහාත් යොදාගනු ලබයි. මෙහිදී නිවාස සහ භෝග වගා බිම උස්ව පිහිටන සේ සකස් කරගත යුත්තේ සෑම වසරකම ග්‍රීස්ම ඍතුවේ රතු ගංගාවේ ඩෙල්ටා ප්‍රදේශවල ඇතිවන මහ ජල ගැල්මෙන් හෝ නිරතුරුව ඇතිවන ගංවතුරෙන් මෙම ඉඩම් ආරක්ෂා කරගැනීම සඳහාය. අධික වර්ෂාපතනය සහ එම ඉඩම්වල පවතින අධික ජල රඳා පැවැත්ම නිසා ඉහත කී පස් කණින ලද අගාධය නිරන්තරයෙන්ම කුඩා පොකුණක් බවට පත්වෙයි. මේ ක්‍රමයට ඉතිරිවන උස් කුඩා බිම් ප්‍රදේශය තුළ බෝග වගාවත්, සත්ව පාලනයත් සහ පොකුණ තුළ මිරිදිය ධීවර කර්මාන්තයත් තම නිවසට ආසන්නව ඒකාබද්ධව කළ හැකිය.

ඉවක් බවක් නොමැතිව අධික ලෙස යෙදුණු රසායනික පොහොර හා තෙල්වර්ග හේතුවෙන් වැව් අමුණු, ඇල-වේලි පද්ධතියේ පැවති කුරුළු හා මත්ස්‍ය සම්පත ද, ආහාර ද්‍රව්‍ය වශයෙන් භාවිතා වූ ජලජ පැළෑටි වර්ග ද ක්‍රම ක්‍රමයෙන් විනාශ වන්නට විය. අධික ලෙස කෙරුණු වනසම්පත් විනාශය හේතුවෙන් ඉතා වටිනා වන සම්පත් හා වනජීවී සම්පත් ද සීඝ්‍රයෙන් විනාශමුඛයට යමින් පවතී. විශේෂයෙන් තෙත් කලාපයේ කෘෂිකාර්මික ඉඩම් වල විධිමත් වග විභාගයකින් තොරව කම්හල් තැනීම, නිවාස ඉදිකිරීම ආදී කාර්යයන් සඳහා සීඝ්‍රයෙන් ගොඩකරගෙන යෑමෙන් ඉතා සරුසාර පොල් වගාවන් කපාදැමීම නුදුරු අනාගතයේදී භයානක අහිතු විපාක ගෙන දෙන ප්‍රවණතාවයක් විය හැකි බවත් අවබෝධ කරගත යුතුය.

ශ්‍රී ලංකාවේ තත්ත්වය මෙසේ වුවද දකුණු අග්නිදිග ආසියාවේ බොහෝ රටවල් ස්වකීය කෘෂිකර්ම සංවර්ධන ප්‍රයත්නයේදී ඔවුන්ගේ සාම්ප්‍රදායික ඒකාබද්ධ ගොවිපොල සැලසුම් ක්‍රම හා පරිචයන් නූතන තාක්ෂණය හා විද්‍යාත්මක දැනුම ආශ්‍රයෙන් නවීකරණය කර ගැනීමට අධිෂ්ඨානශීලී ප්‍රයත්නයක් දැරූ බව මේ සම්බන්ධයෙන් වියට්නාමයේ, ඉන්දුනීසියාවේ, තායිලන්තයේ සහ ඉන්දියාවේ ක්‍රියාත්මක කෙරෙමින් පවත්නා වැඩපිළිවෙල වලින් මනාව පැහැදිලි කරවයි. ඉන්දියාවේ "සර්ව සේවා" ගොවිපොල සංවිධානය විසින් තමිල්නාඩු ප්‍රාන්තයේ වෙන්ගල්පත්තු ප්‍රදේශයේ පුලියාති ග්‍රාමයේ මිරිදිය මත්ස්‍ය වගාව ඇතුළු ඒකාබද්ධ ගොවිපොල සැලසුම් ක්‍රමයක ආදර්ශනයක් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ සෑම රටකම පාහේ කෘෂිකර්මයට සම්බන්ධ භෞතික පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා කෘෂිකර්ම කාර්යයන් හැඩගස්වා ගැනීමට මහත් පරිශ්‍රමයක් දරනු ලැබේ.

මිරිදිය මත්ස්‍ය වගාව හා සත්ව පාලනය සමඟ ආර්ථික වශයෙන් ඉතාමත්ම ලාභදායී මිශ්‍ර ගොවිපොළ ක්‍රමයක් පිළිබඳ ඉතා කදිම නිදර්ශනයක් වියට්නාමයෙන් ලබගත හැකිය. වියට්නාමයේ වැක් (VAC) නමින් හැඳින්වෙන ඒකාබද්ධ ගොවිපල ක්‍රමය අතිශයින්ම වේගවත් ක්‍රියාකාරිත්වයකින් සහ සාර්ථක ඵලදායිතාවයකින් යුක්තවූවකි. එම ක්‍රමය තුළ ආහාර සඳහා භෝග වර්ග වගා කිරීමත්, මිරිදිය, ධීවර නිෂ්පාදනය සහ සත්ව පාලනයත් ඇතුළත්වෙමින් මෙම ක්‍රමය ඒකාබද්ධ වී ඇත. වියට්නාමයේ පිහිටි රතු ගංගාධාරයට අයත් ප්‍රධාන වශයෙන්ම වී නිෂ්පාදනය කරන ඩෙල්ටා ප්‍රදේශවල මෙම ක්‍රමය සම්ප්‍රදායිකව බිහිවිය. දැනට මෙම ක්‍රමය එරටේ බොහෝ ප්‍රදේශවල භාවිතයට ගනු ලබන අතර, 1986 දී වියට්නාමයේ කෘෂි භෝග වගා කරන්නන්ගේ සංවිධානය මෙම ක්‍රමය තවදුරටත් නංවාලීම සඳහා සුදුසු පියවර ගත්තේය. මෙයට ප්‍රධාන හේතුව වූයේ දශක කීපයක් තිස්සේ පැවති යුද්ධය නිසා වියට්නාම් කෘෂිකර්මයේ ඇතිවූ පසුබෑස්මයි. මේ නිසා බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල මන්ද පෝෂණය හා දුගීභාවය පැතිර ගියේය.

සම්පූර්ණ වැක් ඒකාබද්ධ ගොවිපල සැලසුම් ක්‍රමය ගොවිපල හිමියා සහ ඔහුගේ පවුලේ අය විසින් පාලනය කරනු ලබයි. ගොවි පවුල් විසින් මෙම ගොවිපල නිෂ්පාදන අලෙවි කරනු ලැබේ. පරිභෝජනයට වෙන්කළ පසු ඉතිරිවන කොටස් අලෙවි කිරීමටත්, අපද්‍රව්‍ය ගොවිපලේ කාබනික පොහොර ලෙසට යොදා ගැනීමටත් කටයුතු කෙරේ. වැක් ගොවිපල ක්‍රමය වැඩියෙන් ශ්‍රමය භාවිතයට ගන්නා අතර, එමගින් වැඩි ඵලදායීතාවයක් ඇති රැකියා රැසක් ජනිත කරයි. එය විවිධ වයස් කාණ්ඩවලට අයත් පුද්ගලයන්ට රැකියා සපයාදෙන අතර, එයට ඉතාමත් වෙහෙස මහන්සි වී වැඩ කළයුතු අධික ශ්‍රම ශක්තියක් අවශ්‍ය නොවේ. වැක් ගොවිපල ක්‍රමය විශේෂයෙන්ම කාන්තාවන්ට වැඩකළ හැකි හිතකර පරිසරයක් නිර්මාණය කරන බැවින්, එය අයිති පවුලේ නිවසටත්, දරුවන්ටත් භෞතික වශයෙන් ඉතාමත් සමීපව පවතී. මෙම ක්‍රමය ඉතාමත් වැදගත්වන්නේ කාන්තාවන් දුරින් පිහිටි කුඹුරුවල හෝ වෙනත් වැඩ බිම්වල සේවයට යනවාට වඩා මෙහි ඇති පහසුකම් සහ සුරක්ෂිතභාවය නිසාය.

බොහොමයක් ගොවි පවුල් වී වගාව පමණක් කළ අතර, මෙම වැක් ක්‍රමය මගින් පහසුවෙන් අනුගමනය කළහැකි භෝග විවිධාංගීකරණයක් හඳුන්වා දුන්හ. මෙම භෝග අතර අධික පෝෂණ ගුණයෙන් යුක්ත එළවළු හා පළතුරු වර්ග ද, ධීවර නිෂ්පාදනවල අඩංගු අධික සත්ව ප්‍රෝටීන් ද ඉතාමත් ක්‍රියාකාරී ලෙස රටේ පැවති මන්ද පෝෂණය තුරන්කිරීමෙහිලා දායක විය. එමෙන්ම මෙම ප්‍රවේශය නිසා ග්‍රාමීය ප්‍රදේශවල වැසියන්ගේ ආදායම් මට්ටම් ද සීඝ්‍රයෙන් ඉහළ ගියේය. පර්යේෂණ අධ්‍යයන වාර්තා පෙන්වාදෙන අන්දමට රතු ගංගාධාරයේ ඩෙල්ටා ප්‍රදේශවල ජීවත්වන විවිධ ප්‍රජාවන්ගේ ආදායමින් 50%-70% ක ප්‍රමාණයක් මෙම 'වැක්' ඒකාබද්ධ ගොවිපල ක්‍රමයෙන් ලැබෙන ආදායමෙන් සමන්විත විය. තවද මෙම ප්‍රදේශවල ගොවීන්ගේ වාර්ෂික අදායම් වැඩිවීම එම ප්‍රදේශයේ වර්ෂයකට දෙවතාවක් වී වගාකරන ගොවින්ගේ ආදායමට වඩා තුන් (3) ගුණයක සිට පස් (5) ගුණයක් දක්වා ප්‍රමාණයක් විය. මේ නිසා වැක් ගොවිපල සැලසුම් ක්‍රමය සංවර්ධනයට වියට්නාම් රජයේ සහ යුනිසෙප් (UNICEF) වැනි ජාත්‍යන්තර සංවිධානවල සහයෝගිතාව නොඅඩුව ලැබුණි.

මෙම ක්‍රමයේදී පළමුවෙන්ම වගා ඉඩමේ විශාල වලක් ඇතිවන පරිදි පොළොව හරනු ලබයි. මෙසේ පොළොව කැනීමෙන්ලබාගන්නා පස් නිවාසවල අත්තිවාරම් දැමීම සඳහාත්, සතුන්ගේ ගාල් ඉදිකිරීම සඳහාත්, මෙම ඉඩමේ භෝග වගාවට සුදුසු උස් වැටි සහිත පාත්ති සකස් කර ගැනීම සඳහාත් යොදාගනු ලබයි. මෙහිදී නිවාස සහ භෝග වගා බිම උස්ව පිහිටන සේ සකස් කරගත යුත්තේ සෑම වසරකම ග්‍රීස්ම සෘතුවේ රතු ගංගාවේ ඩෙල්ටා ප්‍රදේශවල ඇතිවන මහ ජල ගැල්මෙන් හෝ නිරතුරුව ඇතිවන ගංවතුරෙන් මෙම ඉඩම් ආරක්ෂා කරගැනීම සඳහාය. අධික වර්ෂාපතනය සහ එම ඉඩම්වල පවතින අධික ජල රඳා පැවැත්ම නිසා ඉහත කී පස් කණින ලද අගාධය නිරන්තරයෙන්ම කුඩා පොකුණක් බවට පත්වෙයි. වේ ක්‍රමයට ඉතිරිවන උස් කුඩා බිම් ප්‍රදේශය තුළ බෝග වගාවත්, සත්ව පාලනයත් සහ පොකුණ තුළ මිරිදිය ධීවර කර්මාන්තයත් තම නිවසට ආසන්නව ඒකාබද්ධව කළ හැකිය.

මෙම ගොවිපලේ රසායනික පොහොර භාවිතා කිරීමෙන් තොරව ජීව විද්‍යාත්මක උපක්‍රම මගින් වගා බිම්වල භෝග වර්ග වගාකරනු ලැබේ. විවිධාකාර සත්ත්ව සහ ශාඛ වර්ග වගා කිරීම හා ඇතිකිරීම ඒකාබද්ධව කරන බැවින් පසේ තෙතමනය, සූර්යතාවය, පසේ පෝෂණ ගුණය ආදියෙන් උපරිම ප්‍රයෝජන ගනු ලබයි. පළතුරු වගාව යටතේ අතුරු භෝග වගා ලෙස එළවළු වගාව ඒකාබද්ධව කරනු ලබයි. අනෙකුත් මාශ භෝග වර්ග ගොවිපලේ මායිම අද්දර පිහිටි බිම්වල වගාකරන අතර, දැව අවශ්‍යතාවන් සඳහා අනෙකුත් ගස් වැල් වර්ග වගාකරනු ලැබෙනුයේ ඉඩම් මායිම්වල පිහිටි වැටට

පිහිටන සේය. (පැළ ඉණිවැට වශයෙන් ශ්‍රී ලාංකික ගොවීන් හඳුන්වනු ලබන්නේ මෙයයි.)

විවිධ වර්ගයේ මිරිදිය මසුන් එම පොකුණේ ඇතිකරනු ලැබේ. ජලයේ ගැඹුරුතාවය මත ඒවා විවිධ මට්ටමින් ආහාරය සඳහා යොදාගනී. ඇතැම් ආහාර භෝග ජලාශයට ඉතාමත් නුදුරින් වගා කෙරේ.

ඌරන් සහ කුකුළන් ඇතිකරන කොටු, පොකුණට ඉතාමත් යාබදව පිහිටා ඇත. ඌරන්ගේ අපද්‍රව්‍ය පැළෑටිවල පොහොර ලෙසත් මසුන්ගේ ආහාර ලෙසත් භාවිතා කරනු ලබන අතර, ගොවිපලේ ඇති ඇතැම් ශාඛ කොටස් ද සතුන්ගේ හා මත්ස්‍යයන්ගේ ආහාර ලෙසට භාවිතා කරයි. වියලි කාලගුණයක් සහිත කාලවලදී මේ පොකුණේ ඇති සැරවත් බවින් යුතු අපද්‍රව්‍ය, රොන්මඩ සහ ජලය ගොවිබිම තුළ විසුරුවාලීමෙන් තවදුරටත් පස සාරවත් භාවයට පත්කරයි.

සම්පූර්ණ වැක් ඒකාබද්ධ ගොවිපල සැලසුම් ක්‍රමය ගොවිපල හිමියා සහ ඔහුගේ පවුලේ අය විසින් පාලනය කරනු ලබයි. ගොවි පවුල් විසින් මෙම ගොවිපල නිෂ්පාදන අලෙවි කරනු ලැබේ. පරිභෝජනයට වෙන්කළ පසු ඉතිරිවන කොටස් අලෙවි කිරීමටත්, අපද්‍රව්‍ය ගොවිපලේ කාබනික පොහොර ලෙසට යොදා ගැනීමටත් කටයුතු කෙරේ. වැක් ගොවිපල ක්‍රමය වැඩියෙන් ශ්‍රමය භාවිතයට ගන්නා අතර, එමගින් වැඩි ඵලදායිතාවයක් ඇති රැකියා රැසක් ජනිත කරයි. එය විවිධ වයස් කාණ්ඩවලට අයත් පුද්ගලයන්ට රැකියා සපයාදෙන අතර, එයට ඉතාමත් වෙහෙස මහන්සි වී වැඩ කළයුතු අධික ශ්‍රම ශක්තියක් අවශ්‍ය නොවේ. වැක් ගොවිපල ක්‍රමය විශේෂයෙන්ම කාන්තාවන්ට වැඩකළ හැකි හිතකර පරිසරයක් නිර්මාණය කරන බැවින්, එය අයිති පවුලේ නිවසටත්, දරුවන්ටත් භෞතික වශයෙන් ඉතාමත් සමීපව පවතී. මෙම ක්‍රමය ඉතාමත් වැදගත්වන්නේ කාන්තාවන් දුරින් පිහිටි කුඹුරුවල හෝ වෙනත් වැඩ බිම්වල සේවයට යනවාට වඩා මෙහි ඇති පහසුකම් සහ සුරක්ෂිතභාවය නිසාය.

වියට්නාමයේ පවතින භෞතික පාරිසරික පද්ධතියට අනුකූලවන පරිදි මෙම ක්‍රමය සැලසුම් කර ඇත. එහි පවතින ප්‍රධාන භෞතික පරිසරය භූගෝලීය ලක්ෂණ පදනම් කරගත් ආකාරයට වෙරළබඩ ප්‍රදේශ, ගංගාධාරවල ඩෙල්ටා ප්‍රදේශ,. කඳු බෑවුම් සහිත කඳුකර ප්‍රදේශ වශයෙන් හඳුනාගෙන ඇත.

"වැක්" ඒකාබද්ධ ගොවිපල ක්‍රමය මගින් වියට්නාමයේ පාරම්පරික කෘෂිකර්මය නවීකරණය කිරීම මෙම ප්‍රදේශවල පවතින භූගෝලීය විශේෂිතතාවයන් වූ සුළි සුළං ගංවතුර වැනි සාධක කෙරේ විශේෂ අවධානයක් යොමු කරමින් සිදුකර ඇත.

වෙරළබඩ ප්‍රදේශවල පවතින තද සුළං තත්ත්වයට ඔරොත්තුදෙන පරිදි මෙම වැක් ක්‍රමය සකස් කර ඇත. මේ නිසා සිටුවන ගස් වර්ග සුළං තත්ත්වයට ඔරොත්තුදෙන පරිදි මෙම වැක් ක්‍රමය සකස් කර ඇත. මේ නිසා සිටුවන ගස් වර්ග සුළං බාධකයක් ලෙස ක්‍රියා කරයි. මෙම ප්‍රදේශවල අධික ලවණ සවභාවයට සහ වැලි සහිත තත්ත්වයට ඔරොත්තු දෙන ආකාරයේ විශේෂිත ගස් වර්ග වගාකර ඇත. අනෙකුත් ගස් වර්ග ඉඩමේ වැටවල් සඳහා ඉතා දැඩි උෂ්ණත්වයකින් යුතුව වගා කරන අතර, එමගින් වගාබිම් සඳහා ආරක්ෂාව ලබාදෙයි. එම ගොවිබිම් තුළ විවිධ පළතුරු වර්ග ද වගා කෙරේ. මසුන් හා ඉස්සන් ඇතිකිරීම ප්‍රදේශයේ පොකුණුවල මෙන්ම ඇලවල් ආශ්‍රිතව කරනු ලබයි.

රතු ගංගාධාරයේ ඩෙල්ටා ප්‍රදේශවල විශේෂයෙන්ම පවතින වගුරු සහිත බිම්වල ජලය බැසයාම සඳහා ගොවීන් ගොවිබිම්වල විශාල ඇලවල් ඉදිකර ඇත. ඒවා මගින් සිදුවන ජල වහනයට අමතරව පසේ ඇති ලවණ ගතිය සේදීයෑම නිසාත් එම බිම් භෝග වගාවට සුදුසු තත්ත්වයකට පත්ව ඇත. පසේ පවතින විශේෂ ගුණාංගත්, ජලයේ පවතින විවිධත්වයත්, ඒවායේ සුදුසු බවත් සලකා තෝරාගන්නා ලද පළතුරු වර්ග පමණක් මෙම වගා බිම්වල වගාකරනු ලැබේ. මෙම ඉඩම් වෙරළට තරමක් හෝ ආසන්න වේ නම් පොල් වගාව කරන අතර, අතුරු වගාවන් ලෙසට රඹුටන්, අඹ, දොඩම්, කෙසෙල්, පේර සහ අන්නාසි වගා කෙරේ. තරමක් අභ්‍යන්තර ප්‍රදේශවල නම් පැහිරි කුලයේ ශාඛ බහුල ලෙස වගා කරන අතර, ඒවා සමග කෝපි, කොකෝවා සහ ගම්මිරිස් වගාකර ඇත. ශ්‍රී ලංකාවේ බස්නාහිර හා දකුණු පළාත්වල වගාබිම් බොහොමයක්ම මෙවැනි ගොවිපොල ක්‍රමයක් මගින් ආර්ථික

වශයෙන් විශාල ආදායමක් ලබාගැනීම සඳහා යොදාගත හැකිය.

කඳුකර ප්‍රදේශවල වැඩියෙන් වගාකරනු ලබන්නේ පොළොවට නයිට්‍රජන් මූලද්‍රව්‍ය ලබාදිය හැකි ගස් හා ශාඛ වර්ගත්ය. මේවා මඳ බෑවුම් සහිත බිම්වල ද, දළ බෑවුම් සහිත බිම්වල ද වගා කෙරේ. කඳුකරයේ පහළ නිම්න ප්‍රදේශවල දැව සඳහා ගස් වර්ග වගා කිරීමත් සමගම කෝපි හා තේ සහ අලවර්ග, රටකජු, මාංශ භෝග වර්ග සහ අනෙකුත් පළතුරු වර්ග රාශියක් වගාකරනු ලැබේ. කඳු බිම්වල ඉදිකර ඇති කුඩාඅගල් පෙළ සහ අනෙකුත් පළතුරු වර්ග රාශියක් වගාකරනු ලැබේ. කඳු බිම්වල පාංශු ඛාදනය වළක්වාලනු ඇත. අන්නාසි වගාව නිතරම සමෝච්ඡ රේඛාක්‍රමයට ඉදිකරන ලද වැටි අනුව සිදුකර ඇත. කඳු පාමුල ගොවි නිවාස පිහිටා ඇති අතර, ඒ ආශ්‍රිතව එළවළු වගාව, සතුන්ගේ නිවාස හා මත්ස්‍ය පොකුණු පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ මධ්‍යම, සබරගමුව හා ඌව පළාත්වල බොහෝ ගොවිබිම්වල මෙවැනි ගොවිපොළ ක්‍රමයක් ක්‍රියාත්මක කළ හැකිය.

වැක් ඒකාබද්ධ ගොවිපල සැලසුම් ක්‍රමයේ ව්‍යාප්තිය සඳහා වියට්නාම් අධිකාරීන් විසින් උපාය මාර්ගික විධි ක්‍රමයක් අනුගමනය කර ඇත. මෙම උපාය මාර්ගික විධි ක්‍රමය නම් ගොවි පොළ ආදර්ශනයක් පිහිටුවා, පසුව එය අනෙකුත් ක්ෂේත්‍රයන් කරා ව්‍යාප්ත කිරීමය. මුලින්ම ඒ සඳහා අත්දැකීම් සහිත නියමු ගොවිපළක් ඒ ඒ භූගෝලීය ප්‍රදේශවල තෝරා ගනු ලැබේ. පසුව තෝරාගත් ගොවිපල තුළ වැක් ඒකාබද්ධ ගොවිපල සැලසුම් ක්‍රමයේ තාක්ෂණික උපක්‍රම හඳුන්වා දෙන අතර, ඒවා ගොවිපල තුළදී පුහුණුවීම්, සම්මන්ත්‍රණ, ක්ෂේත්‍ර ආදර්ශන හා ප්‍රායෝගික අභ්‍යාස සහ වැක් ගොවිපොළ හිමියන්ගේ සංවිධාන පිහිටුවීමෙන් සිදු කර ඇත. මෙම පදනම මත නියමු ආදර්ශ ගොවිපළ තමාගේම පවුලේ සාමාජිකයන් විසින් වැක් ඒකාබද්ධ ගොවිපළ සැළසුම් ක්‍රමයක් බවට පත් කරනු ඇත. මේ සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ ලෙස සතුන්, වැඩි දියුණුකළ බීජ වර්ග සහ අදාළ ලිපි ලේඛණ මෙම ඒකාබද්ධ ගොවිපළ සැළසුම් ක්‍රමයේ බලධාරීන් විසින් සපයනු ලැබේ. ඉන්පසු වැක් ක්‍රමයේ ගොවිපල නිරායාසයෙන්ම බිහිවනු ඇත. පළමු ප්‍රතිපල අත්කර ගැනීමෙන් පසු මෙම ගොවීන් එකට රැස්වන අතර, ඔවුන් විසින් පුහුණුවන්නන් සඳහා පුහුණුවීම් කටයුතු සංවිධානය කරනු ලැබේ. ඉන් පසු එම අත්දැකීම් අසල්වාසී ප්‍රජා කණ්ඩායම් වෙත ළඟා කර දෙන අතර, එකමුතුව වැඩ කිරීමෙන් ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කරගනු ලැබේ. මෙයින් ලැබෙන ප්‍රතිඵල ලෙසට මෙහි ප්‍රයෝජනය සහ සාර්ථකත්වය දේශීය ජනතාවට හොඳින් අවබෝධ වන අතර, වැක් ක්‍රමය භාවිතය තව දුරටත් අවට ප්‍රදේශ කරා ව්‍යාප්ත වනු ඇත. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ හා කළුතර යන දිස්ත්‍රික්කවල මෙවැනි ප්‍රදර්ශනාත්මක නියමු ගොවිපොලවල් කීපයක් ආරම්භ කළහැකිය.

වියට්නාම රජයේ නව ප්‍රතිපත්තිය වනුයේ ස්වශක්තිය තුලින් නැගී සිටින ගොවි ජනතාව ධෛර්යමත් කිරීමත්, ඔවුන් දිරිගන්වා නංවාලීමත්ය. වැක් ඒකාබද්ධ සැලසුම් ක්‍රමය වියට්නාම් ගොවි ජනතාවගේ ස්වශක්තිය මෙන්ම ආදායම ද වර්ධනය කරන්නේය. වැක් ව්‍යාපාරය එරට ගොවි ජනතාවගේ ජීවන මට්ටම නංවාලීමේ වැදගත් කාර්යභාරයක් ඉටුකරන අතර, වියට්නාම් කෘෂිකර්මයේ විවිධාංගිකරණයක්ද ඒ මගින් සිදුවෙමින් පවතී. එසේම එය ස්වාභාවික සම්පත් ආරක්‍ෂා කරමින් තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය පාරිසරික සංරක්ෂණයද තහවුරු කිරීමට යොමුවී තිබේ. එමෙන්ම එය ඉතාමත් වැදගත් වන්නේ විශේෂයෙන් ආර්ථික වශයෙන් පහළ ස්ථරවල ජනතා කොටස්වලට ප්‍රමාණවත් අයුරු ප්‍රෝටීන පදාර්ථ ලබාගැනීම සඳහා දවසේ ආහාර වේල් තුනටම මාළු සපයාගත හැකිවීමෙන් මන්ද පෝෂණය වළක්වා ගත හැකි ලෙහෙසි පහසු මාර්ගයක් වී තිබීමයි.

1948 ශ්‍රී ලංකාවට දේශපාලන නිදහස ලැබීමෙන් පසු මිරිදිය මත්ස්‍ය වගාව හා සත්ව පාලන කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ ගොවි පොළ සැලසුම් ක්‍රමයක් වශයෙන් නොවූවත් යම් යම් පියවරවල් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. එහෙත් මෙම ක්ෂේත්‍රවල සම්ප්‍රදායික කාර්යයන් වඩාත් විධිමත් කොට උචිත ව්‍යාප්ති සේවාවක් මගින් ඒවා කෘෂිකර්මයේ ඒකාබද්ධ අංගයන් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රමවත් උත්සාහයක් මෙතෙක් දරා නැත.

ධීවර අමාත්‍යාංශයේ සහනාධාර වැඩපිළිවෙලක් යටතේ මිරිදිය මත්ස්‍ය වගාව සඳහා ගෘහස්ථ පොකුණු තනාගැනීම පිණිසත්, වැව් අමුණු ජලාශවල මසුන් බෝකිරීම පිණිසත් මසුන් අල්ලා ගැනීම සඳහා මිරිදිය ධීවරයින්ට බෝට්ටු හා ආම්පන්න ලබාදීමටත් 70 හා 80 දශකවල වැඩ සටහන් කීපයක්ක්‍රියාත්මක විය. මෙම වැඩ සටහන්වල ප්‍රතිඵලයක් වශයෙන් 1970 දී ටොන් 8000ක් වූ ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය, 1989 වනවිට ටොන් 40000 දක්වා වැඩි විය. මෙය දිවයිනේ මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් 20%ක් පමණ වේ. (රජයේ අනුග්‍රහය යටතේ ආරම්භ කරන ලද මිරිදිය වැව් අමුණු ජලාශවල මසුන් බෝකිරීමේ වැඩපිළිවෙල මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය. ) එසේවුවද 1990 දී මිරිදිය මත්ස්‍ය කර්මාන්තයට දුන් රාජ්‍ය අනුග්‍රහය නවතාලීමට ගත් ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 1994 වනවිට මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ටොන් 12,000 දක්වා පහළ වැටුනි.

ශ්‍රී ලංකාවේ චිරත්තනව පැවත එන ආගමික හා සංස්කෘතික සම්ප්‍රදායන් හා ඇබ්බැහිකම් සම්බන්ධව සීමාවන් යටතේ වුවද ශ්‍රී ලාංකික ජනතාවගේ ආහාර වේලෙහි සත්ත්ව ප්‍රෝටීන 70%ක් පමණ සපයාගනු ලබන්නේ මාළු පරිභෝජනයෙනි. එහෙත් දැනට සමස්ථයක් වශයෙන් ගත්කළ ඒකපුද්ගල මාළු පරිභෝජනය කි.ග්‍රෑම් 11 ක් පමණ වේ. මිරිදිය මත්ස්‍ය වගාවට දිවයිනේ ඇති ඉඩප්‍රස්ථා සුලභ වුවද ඒවා සංවර්ධනය කිරීම කෙරෙහි විධිමත් සැලසුමක් නොමැතිකමින් මුහුදු මාළු සඳහා වූ ඉල්ලුම අධික ලෙස වැඩිවෙමින් පවතින අතර ඒවායේ අධික මිල හේතුවෙන් සාමාන්‍ය ජනතාවට මිලදී ගැනීමට පුළුවන්කමක් නැත. ඉල්ලුමට සරිලන සේ මාළු නිෂ්පාදනය නොවන හෙයින් උම්බලකඩ, කරවල, හාල්මැස්සන් හා ටින් මාළු ආදිය ආනයනය කිරීමට රජය පෙළඹී ඇත. 1992 සිට 97 දක්වා මෙරටට ආනයනය කරන ලද කරවල, හාල්මැස්සන් හා උම්බලකඩවල වටිනාකම වශයෙන් රුපියල් බිලියන 1.6ක් වැය කොට ඇති බව අංක 1 හා 11 දරණ වගුවල දක්වා ඇත. එහෙත් මෙසේ ආනයනය කරන ලද ද්‍රව්‍යවල මිලද ඉතා ඉහළ මට්ටමක පවතින හෙයින් විශේෂයෙන් අඩු ආදායම් ලබන ජනතා කොටස් අතර ප්‍රෝටීන ඌණතාවය හේතුවෙන් මන්දපෝෂණය පැතිරයෑම වැළැක්විය නොහැකිය. අඩු ආදායම් ලබන කොටස් අතරද ප්‍රෝටීන ඌණතාවය සහ මන්ද පෝෂණයට බෙහෙවින් ගොදුරුවන්නේ ගැබිනි මව්වරුන් හා ළදරුවන් බව නොරහසකි. ශ්‍රී ලංකාවේ උපදින සෑම දරුවන් හතර දෙනෙකුගෙන්ම එක් දරුවකු උත්පත්තියේදී බර හා උස හීනතාවලින් පෙළෙන බව වාර්තා වී ඇත. උපත ලබා මුල් අවුරුදු දෙකතුළ මොළයේ වර්ධන වේගය ඉතාමත්ම අඩුබව ද වාර්තා වී තිබේ. මේ තත්ත්වය හා මාළු නිෂ්පාදනයේ හිඟය මෙන්ම අධික මිල හා ආනයනය කෙරෙන එම ද්‍රව්‍යවල අධික මිල මට්ටම් අතර ප්‍රබල සම්බන්ධත.ාවයක් තිබෙන බව උපකල්පනය කළ හැකිය. මේ නිසා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුවිය යුතුය.

මිරිදිය මත්ස්‍ය කර්මාන්තය කෘෂිකර්මය හා සම්බන්ධ කොට ආර්ථික කාර්යයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේද ඉතා කදිම සම්පත් පදනමක් තිබේ. දිවයිනේ මහා වාරිමාර්ග ජලාශවලට ඉඩම් හෙක්.70,850ක් පමණ ඇතුලත් වී ඇත. තවත් හෙක්.17,004 ක් පමණ මධ්‍යම පරිමාණයේ වාරි ජලාශවලට ද වාරික වශයෙන් ජලය රැස්කෙරෙන කුඩා වැව් පොකුණු සඳහා තවත් හෙක්. 1,00,000ක්ද සුළු වාරිමාර්ග යටතේ තවත් හෙක්.39,271ක් පමණ ද ඇතුළත් වී ඇත. මේ අනුව මිරිදිය මත්ස්‍ය වගාව සඳහා කෙළින්ම භාවිතා කළහැකි ධාරිතාවය හෙක්. 2,27,125 ක් පමණ යැයි නිගමනය කළ හැකිය. මීට අමතරව තෙත් කළාපයේ බොහෝ ප්‍රදේශවල වගුරු බිම් කලපු හා කුඹුරු ඉඩම්වලද විධිමත් සැලසුම්කරණයක් මගින් තවත් හෙක්ටයාර් 30,000 පමණ ධාරිතාවයක් මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සඳහා යොදාගත හැකිය. මෙතෙක් විධිමත් සැලසුම්කරණයක් මගින් මෙම සම්පත් පදනම ප්‍රමාණවත් අයුරු ප්‍රයෝජනයට ගෙන නොමැත.

1994 දී යළිත් මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සඳහා රාජ්‍ය අනුග්‍රහය දැක්වීමට තීරණය කිරීමෙන් පසු මිරිදිය මත්ස්‍ය කර්මාන්තය නගාසිටුවීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ජලජ සම්පත් සංවර්ධන අංශයක් පිහිටුවනු ලැබීය. එම අංශය විසින් ජලජ සම්පත් ප්‍රවර්ධනය සඳහා 1995 සිට 2000 දක්වා උපාය මාර්ග

ඇතුළත් වැඩ සටහනක් සකස් කරනු ලැබීය. මෙම වැඩ සටහනේ අරමුණු මෙසේ දක්වා ඇත.

1. විශේෂයෙන් ග්‍රාමීය ජනතාවගේ ආහාරවේල සඳහා ප්‍රෝටීන සපයාගැනීමේ ප්‍රධාන මාර්ගයක් වශයෙන් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම,
2. ජලජ හා මිරිදිය ධීවර සම්පත් සංවර්ධනය මාර්ගයෙන් ආදායම් සහ රැකියා අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම,
3. උසස් වර්ගයේ මසුන් අපනයනයෙන් ආදායම් වර්ධනය කිරීම

මෙම වැඩ සටහනට අනුව මිරිදිය ජලජ සම්පත් සංවර්ධනය කරනු ලබන්නේ විශේෂයෙන් ග්‍රාමීය පෙදෙස්වලය. මේ සඳහා අවශ්‍යවන මාළු බීජ සැපයීම පිණිස පුද්ගලික අංශය, ග්‍රාමීය ප්‍රජාවන් සහ වතු කම්කරුවන් ආදීන් සහභාගි කරවාගෙන වැඩපිළිවෙලක් දියත් කිරීමට ජලජ සම්පත් සංවර්ධන අංශය බලාපොරොත්තු වෙයි.

මෙම සැලැස්මේ ඉලක්ක සපුරාගනු සඳහා දිවයිනේ සෑම ප්‍රදේශයකම වාගේ පවතින වී ගොවිතැනට සම්බන්ධ කරගත් යටිතල ව්‍යුහය ද ඒ හා සම්බන්ධ ගොවිතැන් රටාව ද ප්‍රයෝජනයට ගතහැකිය. මෙම ගොවිතැන් රටාව ක්‍රියාත්මක වන ප්‍රදේශවල මත්ස්‍ය පැටවුන් බෝකිරීම මෙන්ම පරිභෝජනය සඳහා අවශ්‍ය මාළු ද නිෂ්පාදනය කර ගැනීමට බොහෝ ඉඩ ප්‍රස්ථා තිබේ. එසේම ඉතා සූක්ෂම ලෙස ප්‍රයෝජනයට ගතහැකි මානව හා ස්වාභාවික සම්පත් ද විශේෂයෙන් ග්‍රාමීය පෙදෙස්වල විසිරී ඇත. මේ සියළුම කරුණු සැළකීමේදී ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් ක්‍රියාමාර්ග දෙකක් අනුගමනය කළ හැකිය.

1. පවත්නා මිරිදිය ජල ධාරිතාවය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම
2. වී වගාව සමඟ ඒකාබද්ධ ගොවිපොල සැලසුම් ක්‍රමයක් යටතේ මත්ස්‍ය වගාව

## පවත්නා මිරිදිය ජල ධාරිතාවය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම

දැනට දිවයිනේ මහා වාරිමාර්ග ජලාශවලට ඉඩම් හෙක්. 70,850ක් ද හා මධ්‍යම පරිමාණයේ ජලාශවලට තවත් හෙක්. 17,004 ක් ද ඇතුළත් වී තිබේ. මෙම ජලාශවලට ඉතා ඉක්මණින් බෝවන උසස් වර්ගයේ මසුන් වර්ග ඇතුළත් කළ හැකිය. මේ සම්බන්ධයෙන් 70 හා 80 දශකවල වැඩ සටහන් කිපයක් ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම වැඩ සටහන් යටතේ දිවයිනේ ප්‍රධාන මහා වාරිමාර්ග ජලාශවලට මෙම මසුන් වර්ග ඇතුළත් කිරීමෙන් මිරිදිය ධීවර කර්මාන්තය වාණිජමය පදනමක් මත කිරීමට කටයුතු සලස්වනු ලැබීය. මෙම වැඩ සටහන නැවතත් සමාලෝචනය කොට විධිමත් සංවිධාන පදනමක් යටතේ වඩාත් ප්‍රවර්ධනය කිරීමේ බොහෝ ඉඩකඩ තිබේ. මහා වාරිමාර්ග ජලාශවල මසුන් ඇල්ලීමේ අයිතිය එම ප්‍රදේශවල ජීවත්වන ජනතාවට මෙන්ම බැහැරින් පැමිණෙන ධීවරයින්ට ද ලබාදිය හැක. උදාහරණ වශයෙන් 'අම්පාර දිස්ත්‍රික්කයේ සේනානායක සමුද්‍ර ජලාශයේ මසුන් ඇල්ලීමේ අයිතිය එම දිස්ත්‍රික්කයේ සිංහල දෙමළ හා මුස්ලිම් ධීවරයින්ට මෙන්ම වරින් වර බැහැරින් පැමිණෙන ධීවරයින්ටද ලබාදී ඇත. කලකට පෙර පදවිය වැනි මහා වාරිමාර්ග ජලාශවල මසුන් ඇලීමේ අයිතිය මීගමුව ප්‍රදේශයෙන් පැමිණි ධීවර පිරිසකට ලබාදී තිබුණි. නාච්චාදුව, රාජාංගනය වැනි ජලාශවල මසුන් ඇල්ලීමේ අයිතිය බොහෝ සෙයින්ම ලබාදී ඇත්තේ එම ප්‍රදේශවල වාසය කරන ධීවර කාර්මිකයින්ටය. මෙම වැඩපිළිවෙල විධිමත් කොට එම ප්‍රදේශවල ජනතාවට මෙන්ම බැහැරින් පැමිණෙන ධීවරයින්ට ද ආර්ථික කාර්යයන් වශයෙන් ධීවර කර්මාන්තයේ යෙදීමට රැකියා අවස්ථාවන් සපයාදිය හැකිය. මේ සඳහා මෙම ව්‍යාපාරයල පිහිටා ඇති ගොවි සංවිධානවල සහභාගිත්වයද ලබාගත හැකිය. පුත්තලම් දිස්ත්‍රික්කයේ ඉහිනිමිටිය ජලාශයේ මාළු අල්ලාගැනීම සඳහා එම ජලාශයේ ධාරිතා ප්‍රදේශයේ මහදිවුල්වැව ගොවි සංවිධානයට අවසර ලබාදී තිබේ. මෙම වැඩපිළිවෙලවල් තව තවත් විධිමත් කොට වෙනත් ප්‍රදේශවලටද ව්‍යාප්ත කළ හැක.

මහා වාරිමාර්ග ජලාශවලට අමතරව වාරික වශයෙන් ජලය රැස්කරන කුඩා වැව් පොකුණු සඳහා තවත් හෙක්. 1,00,000 ක්ද, සුළු වාරිමාර්ග ක්‍රම යටතේ හෙක්. 39,271ක්ද ජල ධාරිතාවයට ඇතුළත් වී තිබේ. කලක සිට සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය හා නඩත්තුව සම්බන්ධයෙන් රජය විසින් විවිධ වැය ශීර්ෂයන් යටතේ විවිධ දෙපාර්තමේන්තු හා ආයතන මගින් මූල්‍ය සම්පත් යොදවනු ලැබේ. එහෙත් මෙම මූල්‍ය සම්පත් ආයෝජනවලින් ලැබුණු ප්‍රතිලාභ හෝ ඵලප්‍රයෝජන හෝ ප්‍රමාණවත් යැයි කිව නොහැකිය. මෙම ප්‍රතිපාදනවලින් අධික කොටසක් අපතේ ගොස් ඇතිබව පැහැදිලිය. එම නිසා රජය විසින් විවිධ

වැය ශීර්ෂයන් යටතේ ක්‍රියාත්මක කරනු ලබන සුළු වාරිමාර්ග පුනරුත්ථාපන වැඩ සටහන් සමාලෝචනය කොට ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව හා ඔවුන්ගේ සංවිධාන ද කාර්යක්ෂම අයුරු සහභාගීකරවාගෙන ඉතා සීඝ්‍රයෙන් විනාශ වීගෙන යන ග්‍රාමීය වැව් හා ඇල වේලි පද්ධතිය සම්බන්ධ භෞතික පරිසරය යළි ගොඩනගා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කළ හැකිය. 1996 සිට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් විශේෂයෙන් වියළි කලාපයේ ග්‍රාමීය වැව් පුනරුත්ථාපනය පිළිබඳ ඒකාබද්ධ ව්‍යාපෘතියක් සකස්කිරීම සඳහා අවධානය යොමුකරන ලදී.

මෙකී සුළු වාරිමාර්ග පුනරුත්ථාපන වැඩපිළිවෙල සමාලෝචනය කිරීමේදී පහත සඳහන් අන්දමට දුර්වලතාවයන් රාශියක්ම හෙළිපෙහෙළි කර ගැනීමට හැකිවී ඇත. සාම්ප්‍රදායික කෘෂි ආර්ථික රටාවෙන් ඈත්වීමත් සමගම සැලසුමකින් තොරව හා ආවාට-ගියාට කරනු ලබන මැදිහත්වීම් මගින් පෞද්ගලික මතයන්ට අනුකූලව ගන්නා ලද තීරණ අනුරාධපුරය, බදුල්ල, හම්බන්තොට ආදී වියළි කලාපීය ප්‍රජාවන්ගේ සංවර්ධනය හා ප්‍රගතිය අනර්ථදායක හා අක්‍රියතාවයට පත් කරවන්නක් විය. විශේෂයෙන්ම ස්වකීය සමාජයීය, ආර්ථික හා සංස්කෘතික කටයුතු හා බැඳී තිබෙණේයයි එම ප්‍රජාව විසින් විශ්වාස කරන ලද කුඩා ග්‍රාමීය වැව් පිළිබඳ ඇතිවූ තත්ත්වය මෙය ඇස් පනාපිටම පෙන්වන සිද්ධියක් විය. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, සාගිති නිවීමේ ව්‍යාපාර මණ්ඩලය, ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති හා රාජ්‍ය නොවන සංවිධාන විසින් සුළු වශයෙන් හෝ මෙම කුඩා ග්‍රාමීය වැව් සක්‍රිය තත්ත්වයෙන් පවත්වාගෙන යාමට පියවර ගැනීම නිසා ගොවියනට ඉඳහිට වී සහ අමතර ආහාර භෝග වගාව සඳහා අවස්ථාවක් සැලසුණද මෙම වැව්වල ක්‍රියාකාරිත්වය හා නඩත්තුව පවත්වාගෙන ගිය සාම්ප්‍රදායික යන්ත්‍රණය හා සංවිධානය සම්පූර්ණයෙන්ම බිඳීගොස් තිබුණු බැවින්, ඉහත දැක්වූ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් කරන ලද සීමිත මැදිහත්වීම් මගින් වුවද ග්‍රාමීය කුඩා වැව් වටා සංකේන්ද්‍රනය වී තිබුණු සමස්ත කෘෂි ආර්ථික ක්‍රියාවලිය අතපසු කිරීම නිසා ක්‍රම ක්‍රමයෙන් පිරිහීමට යමින් තිබූ තත්ත්වය වළක්වාලීමට සමත් නොවීය. සොරොව්වක් සෑදීම, වැව් බැම්මක් පිරවීම, වානක් සකස් කිරීම වැනි අතනින් මෙතනින් කෙරුණු කටයුත්තක් හැර, මෙම ක්‍රියාවලිය මුළුමනින්ම නිශ්චිත ප්‍රතිඵල හා අරමුණු රහිතව හා තියි මහ පෙන්වීමක් නොමැතිව දරණ ලද අනර්ථකාරී ප්‍රයත්නයක් විය. මෙය දැනුදු මෙම දුර්වලතාවයන් සමගම දිගටම ක්‍රියාත්මක වෙමින් පැවතීම ඉතාමත්ම කණගාටුදායකය.

වියළි කලාපීය ග්‍රාමීය ජනතාවගේ මූලික ආදායම හා ජීවන මාර්ගය වූයේ කෘෂිකර්මයයි. වාරිමාර්ග ක්‍රමයන් අඩපණවීමත් සමගම එම වාරි කර්මාන්තය මත රැඳුණු කෘෂිකර්මය විශ්වාසදායක එකක් නොවූයෙන්, බොහෝ ගොවීහු හේන් ගොවිතැන කෙරෙහි යොමුවූහ. ගොවීහු ටිකදෙනෙක් පමණක් කෘෂි ළිං ක්‍රමය යටතේ අතිරේක භෝග වගාවට පෙළඹුණු ද එහි කිසිදු සංවිධානාත්මක බවක් දක්නට නොතිබුණි. නිශ්චිත සමීක්ෂණ තොරතුරක් දක්නට නොතිබුණද මෙම වැව් යටතේ ජීවත්වූ ජනතාවගෙන් වැඩි කොටසක් මේ අනුව යැපුම් මට්ටමේ හෝ ඊට පෙර පහළින් සිටින බව රහසක් නොවේ. එබැවින් මෙම ක්‍රියාදාමයට කරනු ලබන ඕනෑම මැදිහත්වීමක් එම ජනතාවගේ ජීවන තත්ත්වය සහ ආදායම නංවාලීමට යොමුවුණු අර්ථාන්විත ක්‍රියාවලියක් විය යුතුය. වාරිමාර්ග පද්ධතීන් යළි පිළිසකර කිරීම, දැනට කැඩී බිඳී ගොස් ඇති සාම්ප්‍රදායික සොරොව් හා ඇලවේලි පද්ධතිය වඩා දියුණු තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් නැවත සකස් කිරීම ජනතාවගේ ආහාරමය අවශ්‍යතාවයන් සපුරනවාක් මෙන්ම ඉහළ ආදායමක්ද ලබාදෙන පරිදි සුදුසු භෝග රටාවක් හඳුන්වාදීම, ග්‍රාමීය වැව්වල මිරිදිය කර්මාන්තය යළි ආරම්භ කර වැඩි දියුණු කිරීම මගින් වැව් පුනරුත්ථාපන ක්‍රියාවලිය අර්ථාන්විත කළහැකිය.

ඒකාබද්ධ ගොවිපොල සැලසුම් ක්‍රමයක් මගින් තවත් ගොවිතැන පාදක කොටගත් ආර්ථික හා සමාජයීය ක්‍රියාකාරකම් රැසක් මේ යටතේ ගොනුකර ක්‍රියාත්මක කළ හැකිය. මෙවැනි වැඩපිළිවෙලක් යටතේ ග්‍රාමීය ජනතාවගේ ආදායම් වර්ධනය සඳහා කෙටිකාලීනව හඳුන්වාදීමට හැකි ක්‍රියාවලින් කිහිපයකි. දිගුකාලීන සංවර්ධනයක් සඳහා වූ විභව ශක්තියක් මෙම ප්‍රදේශවල පවත්නා

ස්වාභාවික සම්පත් මගින් ලබාදෙන අතර, එම සම්පත් ලාභදායී හා තිරසාර අන්දමින් කළමනාකරණය කිරීමට හැකියාවක්ද මෙමගින් එම ජනතාවට ලබාදෙනු ඇත. මෙම හැකියාවන් අවදිකර මල්ඵල ගැන්වීම සඳහා එම ජනතාවගේත්, ඔවුන්ගේ සංවිධානවලත් එකඟත්වය ඇතිව පහත සඳහන් ඒකාබද්ධ ක්‍රියාවලින් ක්‍රියාත්මක කළ හැකිය.

සාම්ප්‍රදායික පරිසරයක් තුළදී ගොවි ජනතාව විසින්ම වාර්ෂිකව ස්වකීය වාරිමාර්ගයන් නඩත්තු කර ගැනීමට අවශ්‍ය රොන් මඩ ඉවත් කිරීමෙන් ලබාගන්නා ලද පස්, වැව් බැම්මට යොදා ගැනීම ද වූ අතර, එමගින් වාර්ෂිකව රොන් මඩ තැන්පත් වීම සඳහා අවශ්‍ය අවකාශ වැවතුළම නිර්මාණය විය. රොන් මඩ ඉවත් කිරීමේදී ඇතිවූ මෙම කුඩා වලවල් සොරොව්ව මට්ටමට මදක් පහළින් පිහිටා තිබුණි. මෙම කාර්යය "කට්ටි කැපීම" වශයෙන් හැඳින් වූ අතර, එම වලවල් කට්ටි වලවල්" වශයෙන් නම් කරනු ලැබීය. මේ නිසා අස්වැන්න කපා පාගා ගැනීමෙන් අනතුරුව එළැඹෙන නියං සමය තුළදී වුවද අඩි 4-5 දක්වා වූ ජල ප්‍රමාණයක් වැව තුළ රඳවා ගැනීමට හැකිවිය. මෙම දිය ප්‍රමාණය මත්ස්‍යයන් ඇතුළු ජලජ ජීවීන්ගේ රැක්මට මෙන්ම, ගැමි ජනතාවගේ ආහාරමය අවශ්‍යතාවයන් ඉටුකර දුන් ඕලු, නෙළුම්, කෙකටිය වැනි ජලජ පැළෑටිවල ආරක්ෂාවට ද පිටිවහලක් විය. වැව්වල රොන් මඩ ඉවත් කිරීමේ හෙවත් "කට්ටි කැපීමේ" ක්‍රියාවලියේදී ජනතාවගේ සිත්සතන් තුළ මෙම ප්‍රයෝජන පිළිබඳව සටහන් වී තිබුණි. මෙසේ ලබාගන්න රොන් මඩ වලින් කොටසක් වැව් බැම්මේ ප්‍රයෝජනය සඳහා යොදාගන්නා ලද අතර, කොටසක් වැව් ඉස්මත්තේ ජලාධාර ප්‍රදේශයේ ඇතිවන විවිධ වෙනස්කම් නිසා වැවට එකතුවන පස් ගලා ඒම වැළැක්වීම සඳහා වේදිකාවක් ලෙස යොදාගන්නා ලදී. මෙම වේදිකාව මත ආහාරමය හා දැව අවශ්‍යතාවයන් සපුරා ගන්නාවූත් ලවණ ගතිය උරා ගැනීමේ හැකියාවෙන් ද යුත් කිතුල්, බුරුත හා දිවුල් වැනි ස්ථිර වගාවන් කරන ලදී. එම ප්‍රදේශයේ ඉඩම මනාලෙස සැලසුම් කිරීමෙන් ගොවීනට රැස්වීමට තැනක් මෙන්ම වාර්ෂික සහල් මංගල්‍යය, කිරි ඉතිරවීම වැනි සංස්කෘතික කාර්යයන් සඳහා යොදා ගැනීමට හැකිවිය.

මෙම ක්‍රමය යටතේ වර්ෂය පුරා මෙම කුඩා වැව්වල ජලය රැඳී පවතින නිසා එම ජලය උපයෝගී කරගෙන වැඩිදියුණු කරන ලද මත්ස්‍ය වර්ග හා තාරාවන් වැනි ජලජ පක්ෂිවර්ග වාණිජ මට්ටමින් වගාකිරීම දියත් කළ හැකිය. නිරන්තරයෙන් බෝවෙන මත්ස්‍ය වර්ග මෙම වැව්වලට හඳුන්වාදීම ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇත. මීට අමතරව පෝෂ්‍යපදාර්ථවලින් උසස් මට්ටමක පැවතුණු දේශීය මත්ස්‍ය වර්ග යළි බෝකිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළහැකිය. ඉහතින් දැක්වූ පරිදි වැව් පතුළ හා ජලාධාර ප්‍රදේශය සංවර්ධනය වනවිට ඊට අනුරූපී වන අන්දමින් වගා ප්‍රදේශය (Command area) හා ජලාපවහනය ද දියුණු වනු ඇත. වැවට පහළින් වැව් බැම්ම ආසන්නයේම පිහිටි බිම් තීරුව "කට්ටකාඩුව" තවදුරටත් දැකිය නොහැකි වී තිබේ. එක්කෝ එය අනවසරයෙන් වගාකර ඇත. නැතිනම් එහි අනවසරයෙන් පදිංචිය සඳහා නිවාස ඉදිකර ඇත. මෙම බිම් තීරුවේ එම ගොවි ජනතාවගේ එකඟත්වය ඇතිව (වැව් ඉස්මත්තේ වවන ලද දැව වර්ගවලින් යුත්) වන වගාවන් ඇතිකළ හැකිය. මෙම බිම්තීරුව දිගේ විශාල පරිමාණයේ කෘෂි ළිං පෙළක් සැකසිය හැකි අතර, වර්ෂාව අඩු කාලයට වී වගාකරන ප්‍රදේශයේ ඇති අනෙකුත් භෝග සඳහා එම ළිංවලින් වතුර පොම්ප කළ හැකිය. ඉහළ වටිනාකමක් ලබාදෙන භෝග වගාව මගින් ස්වකීය ආදායම වැඩිකර ගැනීමට මෙ මගින් ගොවි ජනතාවට ඉඩ සැලසෙනු ඇත. කෙසේ වෙතත් මෙම කටයුතු කළ යුතු වන්නේ භූගත ජල ප්‍රමාණය, ජල ධාරිතාවය හා ජලයේ ලවණතාවය පිළිබඳව කරනු ලබන සමීක්ෂණයකින් පසුව පමණි. ඒ අන්දමින් ම කෘෂිකාර්මික හා ධීවර කටයුතු සඳහා ප්‍රයෝජනයට ගතහැකි අන්දමේ පොකුණු කීපයක්ද මෙම ජලාශ්‍රිත ප්‍රදේශයන්හි ඇති කිරීමට පියවර ගත හැකිය. ගව හා එළු පාලනයේ යෙදෙන ගොවීන්ට එම සත්ත්ව පාලනයේදී අවශ්‍යවන ශාක හා පොතුවර්ග වාණිජ මට්ටමෙන් ලබාගැනීම සඳහා අවශ්‍යස්ථිර දැව වර්ග වගාකළ හැකිය. තමන් සතු නොදියුනු ප්‍රාථමික වර්ගයේ සතුන් ඉවත්කොට, ක්‍රමයෙන් වැඩිදියුණු කරන ලද සතුන්

ආදේශනය කළ හැකි පරිදි සත්ව පාලනය ක්‍රමික රටාවකට, ගෙන ආ යුතුය. මෙය ඉතාමත් වැදගත් වන්නේ වියලි පිටි කිරිවලට ආදේශනයක් ලෙස යොදාගත හැකි පරිදි එම ප්‍රදේශවල සිටින විශාල ගව සංඛ්‍යාව දෙස බලන කලය.

## වී වගාව සමඟ මත්ස්‍ය වගාව

ඉහත සඳහන් වැඩපිළිවෙල වී වගාවට අවශ්‍ය යටිතල ව්‍යුහය ආශ්‍රයෙන් ක්‍රියාත්මක කළ හැකි අතර, වී වගාව හා වෙනත් භෝග වගාවද සමඟ මත්ස්‍ය වගාවද ගොවිබිම්වල නව භෞතික සැලසුම් ක්‍රමයක් මගින් ප්‍රවර්ධනය කළ හැකිය. 1994/95 කාලයේ කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සමඟ වී වගාවට සම්බන්ධකොට මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය සඳහා බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පර්යේෂණ අත්හදාබැලීමක් කර ඇත. මෙම අතහදා බැලීමෙන් ඉස්මතු කරගත් කරුණු අළලා ව්‍යාපෘති වාර්තාවක් ද සකස් කොට දැන් ඉදිරිපත් කොට තිබේ. ආරම්භයක් වශයෙන් මෙම ව්‍යාපෘති ඌව, උතුරු මැද හා දකුණු පළාතේ තෝරාගත් ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමට නියමිතය. මේ යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බෙන්තොට ප්‍රදේශයේ ද පර්යේෂණ අත්හදා බැලීමක් ආරම්භ කොට තිබේ. මෙම අත්හදා බැලීම් හා කාර්ය පර්යේෂණවලට අනුව වී වගාව ආශ්‍රිතව මසුන් ඇතිකිරීමෙන් ලැබෙන වාසි පහත සඳහන් අයුරු හඳුනා ගැනීමට හැකිවී තිබේ.

- සමස්තයක් වශයෙන් ගොවීන්ගේ ආදායම් තත්ත්වය දියුණු වීම
- ගොවි පවුල්වල සාමාජිකයන්ගේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු වීම
- පළිබෝධ සහ වල්පැල මර්දනයට පහසුවීම
- ඒකාබද්ධ පළිබෝධ මර්ධන ක්‍රම යොදා ගැනීමෙන් නිෂ්පාදන වියදම් අඩුවීම
- සුරතල් මසුන් අපනයනය තුළින් රටට විදේශ විනිමය ලබාගැනීම
- විනෝදාංශයක් ලෙස මසුන් ඇතිකිරීම

## වී වගාව ආශ්‍රිතව මසුන් ඇතිකිරීමේ විකල්ප

1. මාළුවන්ගේ පසු ලාවේ (සෙ.මී. හා සෙ.මී. 1 දක්වා ) අවස්ථාවේ සිට FRY (සෙ.මී.2.5) අවස්ථාව දක්වා ඇතිකිරීම. මේ සඳහා සති 2 පමණ කාලයක් ගතවේ. දැනට මෙය කෙරෙනුයේ මේ සඳහා සකසන ලද විශේෂ ටැංකි තුළය. එහෙත් අනාගත ඉල්ලුම් වැඩිවීමත් සමග වී ගොවීන්ට මේ සඳහා සම්බන්ධවීමේ හැකියාවක් ඇත. කෙසේවෙතත් මෙය කිරීම සඳහා යම්කිසි මට්ටමක තාක්ෂණ දැණුමක් අවශ්‍ය වේ.
2. FRY අවස්ථාවේ සිට ඇඟිල්ලක ප්‍රමාණ ආකාර (Fingerling) සෙ.මී.5.8) අවස්ථාව මෙම වර්ධන කාලය සති 6 පමණ වේ. මසුන් අභිජනන ආයතනවලට අනාගත ඉල්ලුම සපුරාලීමට කිසිසේත් හැකියාවක් නැත. (වර්ෂ 2000 දී Fingerling මිලියන 32 ක් අවශ්‍ය යැයි ගණන් බලා ඇත.) මේ සඳහා වී ගොවීන්ට සම්බන්ධවීමේ හොඳ අවස්ථාවක් ඇත.
3. ඇඟිල්ලක ප්‍රමාණ ආකාර (Fingerling) අවස්ථාවේ සිට පරිනත අවස්ථාව දක්වා මාළුවන් ඇතිකිරීම. මේ සඳහා සාමාන්‍යයෙන් මාස 4-6 පමණ කාලයක් ගතවේ. වී වගාව යටතේ මෙය කළහැකි ඉඩකඩ සීමිත වුවත් "වැඩිමල්" වී වර්ග යොදා ගැනීමෙන් ප්‍රශස්ත ගණයේ සහල් වර්ග නිෂ්පාදනය කර ගැනීමට හැකිවේ.
4. සුරතල් මසුන්ගේ FRY අවස්ථාවේ සිට වෙළඳපලට යවන අවස්ථාව දක්වා කුඹුරුවල ඇතිකිරීම. මෙය දැනට පුද්ගලික අංශය විසින් හසුරුවන බැවින්, මේ සඳහා පුද්ගලික අංශයේ සහභාගිත්වය අවශ්‍ය වේ. මහවැලි "බී" කලාපයේ සහ පොළොන්නරුව සමහර ප්‍රදේශවල වී ගොවීන් සම්බන්ධ කරගෙන මෙය පවත්වාගෙන යනු ලැබේ.
5. යෝධ මිරිදිය ඉස්සන් ඇතිකිරීම (මැක්‍රොබ්‍රැකියම් රෝසම් බර්ගි) මෙය පුද්ගලික අංශය විසින් හසුරුවන බැවින්, පුද්ගලික අංශයේ සහභාගිත්වය අවශ්‍යවේ.

ඉහත සඳහන් කළ විකල්ප ක්‍රමවලින් ඒ ඒ ස්ථානයට ගැළපෙන සුදුසුම ක්‍රමය තෝරාගත හැකිය. මේ සඳහා කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සමඟ එක්ව ඉහත සඳහන් අත්හදාබැලීම් තුළින් උචිත තාක්ෂණයක්ද හඳුනාගෙන ඇත. මෙම තාක්ෂණයට වී වගාව සහිතව මිරිදිය මත්ස්‍ය වගාවට සුදුසු ස්ථාන තෝරාගැනීම, මසුන් ඇතිකිරීම

සඳහා ක්ෂේත්‍රය පිළියෙල කර ගැනීම, අවශේෂ පොකුණු ක්‍රමය, ලියැද්ද තුළ පොකුණ සාදාගැනීම සඳහා ආදී කාර්යයන් පිළිබඳ අනුගමනය කළ යුතු ක්‍රම විධි අඩංගු වී තිබේ. වී වගාව සමග මත්ස්‍ය වගාව සඳහා හිස ලොකු කාපයා, රෝහෝර්, මේගාල්, තිලාපියා නයිලොටිකා වැනි මත්ස්‍ය වර්ග යොදාගැනීම සුදුසු බවද හෙළිකරගෙන ඇත. මෙයින් තිලාපියා හැරෙන්නට අනෙක් සියලු කාප් වර්ග කෘත්‍රිමව අභිජනනය කළයුතු අතර, දඹුල්ල සහ උඩවලව පිහිටා ඇති ධීවර අමාත්‍යාංශයේ ජලජීවී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානවලින් ලබාගත හැකිය. තිලාපියා ස්වාභාවිකව සාමාන්‍ය පරිසර තත්ත්ව යටතේ තම වර්ගයා බෝකරයි. මීට අමතරව පුරාණයේ පටන් බෝවී ආ නමුත් දැනට වඳවෙමින් පවත්නා දේශීය මත්ස්‍ය වර්ගද යොදාගැනීම කෙරෙහි අවධානය යොමු වී තිබේ.

වී වගාවට සම්බන්ධව මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය අවශේෂ පොකුණු ක්‍රමය වශයෙන් හැඳින්විය හැකිය. මේ "අවශේෂ පොකුණු" දෙආකාරයකට සකස් කළහැකිය

1. කුඹුරේ ලියැදි තුළ පොකුණු සාදාගැනීම

2. සම්පූර්ණ කුඹුරු ඉඩම සඳහා එක් පොකුණක් හෝ දෙකුතුනක් සාදාගැනීම

## 1. කුඹුරේ ලියැදි තුළ පොකුණු සාදාගැනීම

කුඹුරේ ලියැදි දෙකක හෝ තුනක පමණ ආරම්භක අවස්ථාවේදී මිරිදිය මසුන් වගාකිරීම නිර්දේශ කෙරේ. එම ලියැදිවල නියර වටා සෑම පැත්තකින්ම අඩු 1 ක් පමණ පළල, අඩි 1ක් ගැඹුර කාණු සකසාගත යුතුය. ඉහළ වක්කඩ සිට පහළ වක්කඩට අඩි 1ක් ගැඹුර, අඩි 1ක් පළල ප්‍රධාන කාණුවක් සකසාගත යුතුය.

කපාගත් ප්‍රධාන කාණුව හරිමැදට සිටින ලෙස අඩි 5ක විෂ්කම්භය ඇති, අඩි 3ක් ගැඹුරැති වෘත්තාකාර වලක් හෝ අඩි 4ක් පළල, අඩි 5ක් දිග අඩි 3ක් ගැඹුරැති හතරැස් වලක් කපාගත යුතුය. මෙම වලවල්වලට ජලය ඇතුළුවන හා පිටවන දොරටු සඳහා මාළුවන්ට එහා මෙහා යා නොහැකිවන ලෙස දැල් යොදා ගේට්ටු සවිකළ යුතුය. මෙහි අරමුණ වන්නේ ජලය හිඟ අවස්ථාවලදී මසුන් වළතුළ සිටීමයි. ලියැද්දක මෙම අවශේෂ පොකුණු දෙකක් පමණ පිළියෙල කරගත හැකිය. ලියැද්දෙහි පසේ තත්ත්වය අනුව (කඩාවැටෙන පසක් නම්) ගඩොල්වලින් බැඳ වල සකසා ගැනීම නිර්දේශ කෙරේ.

මෙසේ සකසාගත් වල සම්බන්ධ ප්‍රධාන කාණුව සහ නියර වටා ඇති කාණු සම්බන්ධවන ලෙස තරමක් ගැඹුරු කෙත් ඇලවල් සකස් කරගත යුතුය. (දෙවන රූප සටහන) සකසාගත් වලකට අමු ගොම කි.ග්‍රෑම් 05ක් පමණ දමා, වලට වතුර පුරවා සතියක් පමණ තැබිය යුතුය. මේ වනවිට වී වගාව සඳහා මූලික පොහොර යොදා පැළ සිටුවීම කළහැකිය. පොකුණෙහි වතුර කොළ පැහැයෙන් තිබීම අත්‍යාවශ්‍යවේ. එයට හේතුව මසුන්ගේ ආහාර ලෙස ගැනීමට ප්ලවාංග තිබීම අත්‍යාවශ්‍ය නිසාය. මෙම පොකුණ පහළ නියරට ආසන්නව හා සමාන්තරව අඩි 1 1/2 x 1 1/2 කාණුවක් ලෙසද සකස් කරගත හැක.

මෙම ක්‍රමයෙහි දක්නට ලැබෙන විශේෂ වාසියක් නම් ඒ සඳහා අලුතෙන් අමතර වියදමක් කිරීම බොහෝවිට අවශ්‍ය නොවීමයි. කුඹුරෙහි සාදාගන්නා පොකුණුවලට මුළුතැන් ගෙයින් ඉවතලන ද්‍රව්‍ය හෝ බත් ඇට, හාල්, නිවුඩු, පුන්නක්කු, පරණ පාන් කුඩු දිනපතා පොකුණේ හෝ කුඹුරේ නියමිත ස්ථානයකට යෙදිය යුතුය. එහෙත් අනවශ්‍ය ලෙස යෙදීම සුදුසු නැත. මෙයට අමතරව ප්ලවාංග හා ඇල්ගී වර්ධනය සඳහා ගොම පොහොර හෝ කුකුල් පොහොර වළකට කි.ග්‍රෑ. 5ක් පමණ සති දෙකකට වරක් යෙදීම නිර්දේශ කෙරේ. මෙහිදී සඳහන් කළයුතු තවත් විශේෂ කරුණක් ඇත. මේ ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ගවයින්, කුකුළන් වැනි සතුන් ඇතිකිරීමේ වැඩ සටහනක්ද මෙයට ඒකාබද්ධ කළහැකිය. (තුන්වන රූප සටහන)

මාළු පැටවුන් යෙදීමෙන් පසු පළිබෝධ සහ වල්පැල පාලනය සඳහා කෘෂි රසායන යෙදීම නිර්දේශ නොකරන අතර, ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම යොදා ගැනීමට උනන්දු කෙරේ. එහෙත් වැළැක්විය නොහැකි අවස්ථාවක කෘමිනාශක යොදන්නේ නම් ජල මට්ටම අඩුකර මාළු කුඹුරේ පිහිටි පොකුණට සීමාකර යෙදීම නිර්දේශ කෙරේ. මෙයින්ද වියදම් අඩුකර ගැනීමටත් රසායනික විෂ සහිත නාශක ද්‍රව්‍යවලින් ඉවත්වීමටත් අනුබලයක් ලැබේ.

වී වගාව තුළ මිරිදිය මසුන් ඇති කිරීමේදී වී වර්ගය පිළිබඳ සැළකිලිමත් විය යුතුය. වැඩිකලක් ජලය කුඹුරේ රඳවාගත හැකි නිසා වැඩි වයස් වී ප්‍රභේද තෝරාගැනීම වැදගත්වේ. මේ නිසා මාස 4-4 1/2 වී වර්ග යොදාගැනීම නිර්දේශ කෙරේ. මෙයින් ද ඉතා හොඳ ප්‍රමිතියක් සහිත වී සහල් නිෂ්පාදනය කරගැනීමට හැකිවන අතර, දීර්ඝකාලීන වී වර්ගවලින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමටද ඉඩප්‍රස්ථා සැලසේ.

හෝග වගාව, සත්ව පාලනය, මිරිදිය මත්ස්‍ය වගාව, වන වගාව
ආදියෙන් සමන්විත ඒකාබද්ධ ගොවිපොල සැලසුම් ක්‍රමයක ආදර්ශයක්

රූප සටහන 02




## 2. සම්පූර්ණ කුඹුරු ඉඩම සඳහා එක් පොකුණක් හෝ දෙක තුනක් සාදාගැනීම

ඉහත සඳහන් අන්දමට කුඹුරේ ලියැදිවල පොකුණු කීපයක් වෙනුවට සම්පූර්ණ කුඹුරේ ජලය අපවහනය කොට රඳවා තබාගැනීම සඳහා එක් පොකුණක් හෝ කුඹුරේ බිම් පිහිටීමට අනුව පොකුණු දෙක තුනක් හෝ සාදාගත හැකිය. (වියට්නාමයේ "වැක්" ගොවිපොල ක්‍රමයේ පොකුණු මෙන්"), මේ සඳහා ඇතැම්විට කුඹුරු ඉඩමේ නියරවල් හා ලියැදි නැවත සකස්කර පොකුණු සෑදීම සඳහා භාරගනු ලබන පස් ක්‍රමානුකූලව තැන්පත් කිරීම හා කුඹුරේ සෑම පැත්තකම ඇති ජලය පොකුණට හරවාගැනීම පිණිසත්, අවශ්‍ය වූ විට පොකුණෙන් ජලය ඉවත් කිරීමටත්, කානු පද්ධතියක් සකස් කරගැනීම අවශ්‍යවෙයි. බොහෝවිට මෙම පොකුණේ හෝ පොකුණුවල ජලය ඉවත්කිරීම අවශ්‍ය නොවිය හැකිය. ඒ වෙනුවට දිගටම ජලය රඳවා තබා දිගුකල් ජීවත්වන මත්ස්‍ය වර්ග හා ආහාර සඳහා යොදාගත හැකි ජලජ පැළෑටි වර්ග ද, ඕලු, නෙළුම්, මානෙල් වැනි විසිතුරු මල් වර්ග ද වගාකළ හැකිය. මීට අමතරව ගොවියාගේ කැමැත්ත අකැමැත්ත අනුව තාරාවුන් හා මස් පිණිස භාවිතා කළ හැකි වෙනත් ජලජ පක්ෂි වර්ග ද ඇතිකළ හැකිය. මෙයින් ඉතා හොඳ පෝෂණ තත්ත්වයේ ආහාරවේලක් සඳහා විෂ රහිත එළවළු හා මස්මාංශ ලබාගැනීමට හැකිවන අතර, අතිරික්ත අලෙවි කිරීමෙන් අමතර ආදායමක් ද ලබාගත හැකිය. මීටත් වඩා වැදගත්වන්නේ දිගටම පොකුණේ හෝ පොකුණුවල ජලය රැඳී තිබීමෙන් එය හාත්පස ගොවිබිම සෑමදාම සෑහෙන තෙතමනයකින් තබාගතහැකි වීමයි. ඒ මගින් වර්ෂය පුරාම කාලගුණ හා දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන ශෂ්‍ය මාරු ක්‍රමයක් යටතේ විවිධ භෝග වර්ග වගා කළහැකිය. මසුන් හා වෙනත් ජලජ පක්ෂීන් හා මල් සහිත පැළෑටිවලින් සමන්විත ගොවිබිම පුරා ඉතා යහපත් සනීපාරක්ෂක ස්වාභාවික පරිසරයක්ද එයින් මවාගත හැකිය.

**මෙම ක්‍රමය, කොළඹ, ගම්පහ හා කළුතර යන දිස්ත්‍රික්කවල වගුරු හා හැල් සහිත ගොවිබිම්වල ඉතා සාර්ථකව ක්‍රියාත්මක කළහැකිය. මේ මගින්**

# වී වගාව හා මිරිදිය මත්ස්‍ය සමෝධාන වගාව සඳහා ලියැදි තුළ පොකුණු සාදාගැනීම




රූප සටහන 03

මෙම ක්‍රමය පළමුවෙන් සඳහන් කළ ක්‍රමයට වඩා ආරම්භයේදී සැහෙන ආයෝජනයක් අවශ්‍යවන ක්‍රමයකි. කුඹුරේ ලියැදි නැවත සකස්කොට මට්ටම් කරගැනීම හා පොකුණක් හෝ කිපයක් හාරා පස් අවශ්‍ය පරිදි බැමි, වැටි හා උස්බිම් වශයෙන් තැන්පත් කිරීම සඳහා මූලික ආයෝජනයක් අවශ්‍යවේ. කෙසේ වුවද මෙම ආරම්භක ආයෝජනයෙන් පසු එම ක්‍රමය නඩත්තුව හා එලගැන්වීම සඳහා එතරම් ආයෝජනයක් අවශ්‍ය නොවේ. සමස්ථයක් වශයෙන් ගත්කල කන්න දෙක තුනක් ඇතුළත සුළු පරිමාණයේ ගොවිපොළ සැහෙන තරම් ලාභයක් ලබාදෙන ආර්ථික ව්‍යවසායක් බවට පත්කර ගත හැකිය.

ඉඩම් සම්පත්වලින් උපරිම ඵලදායිතාව ලබාගත හැකිවන සේ විධිමත් ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රමයක් බිහිකරගත හැකිය. (තෙවන රූප සටහන)

මෙම ක්‍රමය පළමුවෙන් සඳහන් කළ ක්‍රමයට වඩා ආරම්භයේදී සැහෙන ආයෝජනයක් අවශ්‍යවන ක්‍රමයකි. කුඹුරේ ලියැදි නැවත සකස්කොට මට්ටම් කරගැනීම හා පොකුණක් හෝ කිපයක් හාරා පස් අවශ්‍ය පරිදි බැමි, වැටි හා උස්බිම් වශයෙන් තැන්පත් කිරීම සඳහා මූලික ආයෝජනයක් අවශ්‍යවේ. කෙසේ වුවද මෙම ආරම්භක ආයෝජනයෙන් පසු එම ක්‍රමය නඩත්තුව හා එලගැන්වීම සඳහා එතරම් ආයෝජනයක් අවශ්‍ය නොවේ. සමස්ථයක් වශයෙන් ගත්කළ කන්න දෙක තුනක් ඇතුළත සුළු පරිමාණයේ ගොවිපොළ සැහෙන තරම් ලාභයක් ලබාදෙන ආර්ථික ව්‍යවසායක් බවට පත්කර ගත හැකිය.

ඉහත සඳහන් දෙආකාරයෙන්ම එක හා සමාන ප්‍රතිඵල ලබාගත හැකිය. සුදුසු ආකාරයක් තොරාගැනීම බෙහෙවින්ම රඳා පවතින්නේ ගොවිබිමේ හෝ කුඹුරේ පරිමාණය හා පිහිටීම අනුවයි. මේ දෙආකාරය යටතේම අනුගමනය කළයුතු ගොවිපොළ ක්‍රමයේ නම් එතරම් වෙනසක් දක්නට නොමැත.

මෙම ගොවිපොළ ක්‍රමය සාමාන්‍යයෙන් හඳුන්වනුයේ "ඒකාබද්ධ ගොවිපොල සැලසුම් ක්‍රමය" වශයෙනි. ඉහත සඳහන් අන්දමට මත්ස්‍ය වගා ප්‍රවර්ධනයට අමතරව සත්ත්ව පාලන කටයුතු ද මෙම වැඩපිළිවෙලට ඒකාබද්ධ කරගැනීම අනිවාර්යවේ. විශේෂයෙන් විවෘත ආර්ථිකයක් තුළ සුළු පරිමාණ ගොවීන්ට සාර්ථකව හිස ඔසවා රැ. දෙන්නට නම් මෙවැනි සැලසුම් ක්‍රම මහින් කෘෂිකර්මය කර්මාන්තයක් බවට පත්කරගෙන, එය ආර්ථික වාණිජ කාර්යයක් කරගැනීම අනිවාර්යවේ.

කෙසේවුවද ඒකාබද්ධ ගොවිපොල ක්‍රමයක සාර්ථකත්වය රඳා පවත්නේ ඒවාට සහභාගීවන ගොවීන්ගේ හා ගොවි පවුල්වල ස්ත්‍රී/පුරුෂ සිල්ලන්ගේම ආකල්පයන් අනුවය. කෘෂිකර්ම ව්‍යාප්ති සේවාවන් විසින් නව දෘෂ්ටි කෝණයකින් ව්‍යාප්ති කටයුතු කෙරෙහි අවධානය යොමුකරවීමද අත්‍යාවශ්‍යවේ. මෙවැනි කෘෂිකර්මයක් සඳහා දැනුම, අවබෝධය හා විශේෂයෙන් විද්‍යාත්මක අංශ සම්බන්ධයෙන් සැහෙන අවබෝධයක් තිබීම අත්‍යාවශ්‍ය බැවින් එක් එක් ප්‍රදේශවල පවත්නා ස්වාභාවික සම්පත් හා සමාජ ආර්ථික තත්ත්වයන්ට අනුකූලවන විදියේ තොරතුරු හා දැනුම ලබාගත හැකි මධ්‍යස්ථාන පිහිටුවාගත යුතුය.

එක් එක් ප්‍රදේශවලට අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය, සත්ත්ව ආහාර, ස්වාභාවික පොහොර ආදිය ඒ ඒ ප්‍රදේශවලින්ම නිෂ්පාදනය කරගැනීම අවශ්‍යය. මේ සඳහා 1996 පටන් කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය විසින් දියත් කර ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොවිජන කේන්ද්‍ර වශයෙන් සංවර්ධනය කිරීමේ වැඩ සටහන වේගවත්ව ක්‍රියාත්මක කළයුතුය. ඒ මහින් ගොවි ජනතාවගේත් රාජ්‍ය අංශවලත් ඒකාබද්ධ/හවුල් සැලසුම් ක්‍රමයක් මහින් ඉඩම්, ජලය, ඉන්ධන, ශ්‍රමය හා ප්‍රාග්ධනය සඳහා ඒකකයකින් ලැබෙන ආදායම උපරිකරණය කර ගැනීමට හැකිවන අතර, මෙම අරමුණ පාරිසරික හා සමාජයීය වශයෙන් අනර්ථකාරී නොවන ආකාරයට සපුරාගත හැකිය.

ශ්‍රී ලංකාවේ විරැකියා වර්ධනය හා ඊට අනුපාතිකව පවත්නා කෘෂිකර්ම සම්පත් පදනම සම්බන්ධයෙන් සලකා බලන කල්හි මෙවැනි ගොවිපොල සැලසුම් ක්‍රමයක් මගින් වැඩි වැඩියෙන් ආහාර නිෂ්පාදනය, රැකියා අවස්ථාවන් පාදාදීම හා ආදායම් මට්ටම් වර්ධනය කරගැනීම අවශ්‍යවේ. පාංශු සෞඛ්‍යය, මනා ජල කළමනාකරණය හා පලිබෝධ පාලන ක්‍රම මගින් පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ද ඒ ක්‍රමය වැදගත් වේ. මෑත අතීතයේදී හුදු අධික ලාභ අපේක්ෂාවෙන් කරන ලද කෘෂිකාර්මික වාණිජකරණය සඳහා දියත් කරනලද කෙටිකාලීන ක්‍රමවලින් පහළ වූ ව්‍යසනයන් හා ආපදාවන් දුරුකර ගැනීම සඳහා ඒකාබද්ධ ගොවිපොල සැලසුම් ක්‍රමය බෙහෙවින් ඉවහල්වේ. මේ සඳහා සුදුසු තාක්ෂණ ක්‍රම සොයාගනු පිණිස ගොවීන් සමඟ හවුලේ කෙරෙන කාර්ය පර්යේෂණ සඳහා කෙරෙන කාර්ය පර්යේෂණ සඳහා වැඩි ආයෝජනයක් ලබාදීම ද අවශ්‍යවේ. මීට අමතරව කෘෂිකර්ම හා ඉඩම්, ග්‍රාමීය කර්මාන්ත හා පශු සම්පත් සංවර්ධනය හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය යන අංශ අතර මනා සම්බන්ධීකරණයක් මෙන්ම හවුලේ ක්‍රියාත්මක කළයුතු ප්‍රායෝගික කාර්ය සැලැස්මක්ද අනිවාර්යයෙන්ම අවශ්‍යවේ.

**ආශ්‍රිත ලේඛණ**


i The Hindu Survey of Indian Agriculture 1995

ii ILEIA News Letter March 1995 - A Pubication of the Information Center for Low External Input and Sustainable Agri culture" Kastanjel Leusden" Netherlands.

iii Consolidation Action Plan 1995 - Minis try of Fisheries and Aquatic Recources Devel opment.

iv කෘෂිකර්ම සංවර්ධන ඒකාබද්ධ සහභාගිත්ව ප්‍රවේශය "අමා" වැඩ සටහන, මාර්ගෝපදේශ සටහන් අංක 6 කෘෂිකාර්මික අලෙවිකරණය උදෙසා උපාය මාර්ග හා ක්‍රියාකාරකම් කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය - 1995/96

v වියළි කලාපයේ ග්‍රාමීය වැව්වල රොන්මඩ ඉවත් කිරීම (පුනරුත්ථාපනය) සඳහා අදහස් කීපයක්, ඩී.එම්. ආරියරත්න, ලේකම්, කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය - 1996

vi Historical Relation of Ceylon - Robert Knox

vii Rice Based Farming Systems Develop ment through Aquaculture in Sri Lanka, Rice Research and Development Insti tute, Batalagoda, Innagamuwa - 1998

viii පණස් වසරක අත්දැකීම් තුළින් "නව කෘෂිකර්මයක්" වෙත ඩී.ඇම්. ආරියරත්න උපදේශක "වගා ලංකා" කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයග 1998